# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

# தேசிய இரத்தினக்கல், ஆபரண அதிகாரசபை

# NATIONAL GEM AND JEWELLERY AUTHORITY

## වාර්ෂික වාර්තාව

## ஆண்டறிக்கை

## ANNUAL REPORT

2021

කර්මාන්ත අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

MINISTRY OF INDUSTRIES

# දැක්ම ප්‍රකාශනය

## “ශ්‍රී ලංකාව - කුරුවින්ද අගනුවර බවට පත්කිරීම”

# මෙහෙවර ප්‍රකාශනය

ජාතික ධනය සහ කර්මාන්තයේ කොටස්කරුවන්ගේ ප්‍රසාදය ඇති කිරිම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නීති ගත කිරීම තුළින් කර්මාන්තයේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීම.

# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

## ව්‍යවස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| **ප්‍රධාන කාර්යාලය** | - | ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,<br>අංක. 25, ගාලු මුවදොර ටෙරස්,<br>කොළඹ 03.<br>දුරකථන: 011-2329295/2325364/2390645-8<br>ෆැක්ස් : 011-2320758<br>වෙබ් පිටුව : www.ngja.gov.lk |
| **ප්‍රාදේශීය කාර්යාල ලිපිනයන් සහ දුරකථන අංක** | | |
| ප්‍රාදේශීය කාර්යාලය (කොළඹ) | - | ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,<br>අංක. 25, ගාලු මුවදොර ටෙරස්,<br>කොළඹ 03.<br>දුරකථන: 011-2325364, 2329295, 2390645, 2390651<br>ඊ මේල් : ngjacolr@gov.lk |
| ප්‍රාදේශීය කාර්යාලය (රත්නපුර) | | ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,<br>රත්නපුර.<br>දුරකථන : 045-2223591, 045-2222159, 045-2223592<br>ඊ මේල් :srmratnapura@gov.lk |
| ප්‍රාදේශීය කාර්යාලය (ඇහැළියගොඩ) | | ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,<br>ප්‍රාදේශීය කාර්යාලය ඇහැළියගොඩ.<br>දුරකථන: 036-2258170<br>ඊ මේල් :ngjaehe@gov.lk |
| ප්‍රාදේශීය කාර්යාලය (නාඋල) | | ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,<br>නාඋල.<br>දුරකථන: 066-2246094<br>ඊ මේල් : ngjanaula@gov.lk |
| ප්‍රාදේශීය කාර්යාලය (මොණරාගල) | | ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,<br>1/17, කච්චේරිය පාර, මොණරාගල.<br>දුරකථන: 055-2276124<br>ඊ මේල් :ngjamonr@gov.lk |
| ප්‍රාදේශීය කාර්යාලය (මාතර) | | ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය,<br>අංක : 391, පඹුරණ, මාතර.<br>දුරකථන: 041-2223330<br>ඊ මේල් :ngjamatara@gov.lk |

# මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

# 2021 වර්ෂය

| | නම | | සිට | දක්වා |
|---|---|---|---|---|
| 1. | වයි. කේ. ටී. පී. වීරසිංහ මහතා<br>සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය | සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී | 2020.11.30 | මේ දක්වා |
| 2. | ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර මහතා<br>අධ්‍යක්ෂ, මුදල් අමාත්‍යාංශය | සාමාජික | 2020.01.23 | මේ දක්වා |
| 3. | සුරේෂ් ද මෙල් මහතා<br>සභාපති,<br>ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | සාමාජික | 2021.01.20 | මේ දක්වා |
| 4. | ඒ. ආර්. කේ. විජේසේකර මහතා<br>සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව | සාමාජික | 2021.09.27 | මේ දක්වා |
| 5. | කේ. ඒ. එස්. වල්පොල මහත්මිය<br>අතිරේක ලේකම්, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | සාමාජික | 2021.07.08 | 2022.01.31 |
| 6. | මහාචාර්ය පි. ජී. ආර්. ධර්මරත්න මහතා<br>සභාපති,<br>මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය | සාමාජික | 2021.12.29 | මේ දක්වා |
| 7. | මේජර් ජනරාල් (විශ්‍රාමික) ජී. වී. රවිප්‍රිය මහතා<br>අධ්‍යක්ෂ ජනාරාල් , ශ්‍රී ලංකා රේගුව | සාමාජික | 2020.09.14 | මේ දක්වා |
| 8. | ඩබ්. ඒ. පී. සුමිත් කුමාර මහතා | සාමාජික | 2020.01.01 | මේ දක්වා |
| 9. | එන්. හේමප්‍රිය මල්ලිකාරච්චි මහතා | සාමාජික | 2020.01.01 | මේ දක්වා |
| 10. | අසංක විජේසුන්දර මහතා | සාමාජික | 2020.02.26 | මේ දක්වා |
| 11. | එරංග බස්නායක මහතා | සාමාජික | 2020.01.01 | මේ දක්වා |
| 12. | ආර්. එම්. මොහාන් ජේ. රත්නායක මහතා | සාමාජික | 2020.12.03 | මේ දක්වා |

# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය - 2021

## ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලය

| | නම | අධ්‍යාපන සුදුසුකම් | තනතුරු නාමය |
|---|---|---|---|
| 1 | වයි. කේ. ටී. පී. වීරසිංහ මහතා - සභාපති | | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී |
| **2** | පී. යූ. කේ. තේනුවර මහතා | MPM, B.Com(sp), HNDA, MAAT | අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) |
| **3** | ටී. ඩී. කුලනන්ද මහතා | B.Sc. ( රාජ්‍ය පරිපාලන) | අධ්‍යක්ෂ (බලාත්මක කිරීම් හා ප්‍රාදේශීය සංවර්ධන) |
| **4** | ඒ. එන්. බී. පෙරේරා මහත්මිය | FCA, FMAAT | අධ්‍යක්ෂ (මුදල්) |
| **5** | පී. යූ. කේ. තේනුවර මහතා | MPM, B.Com(sp), HNDA, MAAT | අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) |
| 6 | ජී. ඩබ්ලිව්. අමරසිරි මහතා | B.Sc. Eng (Mining), IESL (AM) | අධ්‍යක්ෂ (ඉඩම්, කැනීම් හා පරිසර) |

## 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ 2021 වසර සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ පාලන වාර්තාව

**01.** 2021 වසර ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 27 වන වසර සනිටුහන් කරයි. සමාලෝචිත වර්ෂය තුළ එහි කාර්යභාරය කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලය සහ රත්නපුරය, ඇහැලියගොඩ, මාතර, නාවුල සහ මොණරාගල ප්‍රාදේශීය කාර්යාල මෙන්ම කටුනායක මැණික් අපනයන මධ්‍යස්ථානය සහ ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටුවා ඇති මැණික් සහ ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානය මගින් මෙහෙයවන ලදි.

**02.** <u>අධිකාරියේ කර්තව්‍යයන්</u>

(අ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම;

(ආ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා යෝජනා ක්‍රම ආරම්භ කර ක්‍රියාත්මක කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුලත හෝ ඉන් පිටත හෝ මැණික් හා ස්වර්ණාභරණ සඳහා වූ වෙළඳපොළ පුළුල් කිරීම සහ මැණික් හා ස්වර්ණාභරණ සඳහා ලෝක වෙළඳපොලේ ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම;

(ඈ) මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය දියුණු කිරීමේ අදහසින් එම කර්මාන්තවලට අදාල සෑම අංශයකම සේවක පිරිස් වලට කාර්මික පුහුණුව, විශේෂයෙන් තාපයෝජනය සහ මැණික් කැපීම පිළිබඳව පුහුණුව, ප්‍රවර්ධනය කිරීම සහ ඊට අනුග්‍රහය දැක්වීම;

(ඉ) අනාගත ගැණුම්කරුවන් තුළ මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය කෙරෙහි විශ්වාසය ඇති කිරීමට අවශ්‍ය වියහැකි පියවරයන් ගැනීම;

(ඊ) නීති විරෝධී මැණික් ගැරීම සහ නීති විරෝධී ලෙස මැණික් ශ්‍රී ලංකාවෙන් ඉවත් කිරීම වැලැක්වීම;

(උ) පතල් කැණීමේ හෝ මැණික් ගැරීමේ අයිතිවාසිකම් යම් ආරක්ෂා කිරීමක් හේතුවෙන් හෝ අන්‍යාකාරයකින් රජය වෙත රැඳී ඇති අවස්ථාවල රජයේ ඉඩම්වල හෝ ඒ මත හෝ රජය විසින් හෝ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් බැහැර කරන ලද ඉඩම්වල හෝ ඒ මත මැණික් පතල් කැණීමේ අයිතිවාසිකම් අන්සතු කරදීම පිළිබඳව වගකිවයුතු එකම බලධරයා වශයෙන් ක්‍රියා කිරීම;

(ඌ) මැණික් හා ස්වර්ණාභරණ අලෙවි කිරීමට අවශ්‍ය කාර්මික සහ වෙනත් උපදෙස් සහ යටිතල පහසුකම් සැපයීම;

(එ) යම් උපලේඛන ගත ලිඛිත නීතියක්-

i එය මැණික් හෝ මැණික් කර්මාන්තය සම්බන්ධයෙන් අදාල වනතාක් දුරට, හෝ

ii මේ පනත යටතේ අධිකාරියේ බලතල කර්තව්‍ය සහ කාර්යය අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනතාක් දුරට එම නීතියේ කාර්ය පරිපාලනය කිරීම;

(ඒ) මැණික් සහතික කිරීම සඳහා සහ වටිනා ලෝහ වර්ග පරීක්ෂා කිරීම සඳහා කාර්යාල පිහිටුවීම:

(ඔ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ස්වර්ණාභරණ නිෂ්පාදිතයකුගේ ඉල්ලීම පිට, නියමිත ආකාරයකට විශේෂ ලකුණකින් මුද්‍රාව තබන බවට වගබලා ගැනීම;

(ඕ) ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා මැණික් කර්මාන්තය, ස්වර්ණාභරණ කර්මාන්තය සහ රජයේ දෙපාර්තමේන්තු අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැගුම හා එම සම්බන්ධීකරණ ක්‍රියාදාමයන් තවදුරටත් වර්ධනය කිරීමේ අතරමැදියා වශයෙන් කටයුතු කිරීම;

(ක) මැණික් කර්මාන්තයේ සහ ස්වර්ණාභරණ කර්මාන්තයේ සේවා නියුක්තයන්ගේ සේවා නියුක්ති නියමයන් සහ කොන්දේසි සහ විශේෂයෙන් එම තැනැත්තන්ගේ ජීවිත සහ ශරීරාංග අනතුරු වලින් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවරයන් ගැනීම සහ ඒවා විධිමත් කිරීම සහ පාලනය කිරීම;

## 03. මූල්‍යය

### 3.1 ද්‍රවශීලතාවය :

වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ රුපියල් මිලියන 54.109 ක්වූ අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 84.908 ක් විය. කල්පිරීමේ ආයෝජන (භාණ්ඩාගාර බිල්පත්) වල වසර ආරම්භයේදි රුපියල් මිලියන 1059.635 ක් වූ අතර එය වසර අවසානයේදී රුපියල් මිලියන 1198.625ක් විය.

වර්ෂය ආරම්භයේදී අනිකුත් මූල්‍ය වත්කම් වටිනාකම රුපියල් මිලියන 836.057ක් වූ අතර වසර අවසානයේදී එය රුපියල් මිලියන 880.82ක් විය.

3.2 **ලාභදායකත්වය :**

| | **2016 රුපි.මිලි** | **2017 රුපි.මිලි** | **2018 රුපි.මිලි** | **2019 රුපි.මිලි** | **2020 රුපි.මිලි** | **2021 රුපි.මිලි** |
|---|---|---|---|---|---|---|
| මුළු අදායම | 698.155 | 665.818 | 588.609 | 604.581 | 427.8 | 676.6 |
| මුළු වියදම | 510.950 | 536.971 | 442.051 | 417.146 | 393.7 | 434.6 |
| ලාභය(බදු වලට පෙර) | 187.205 | 128.847 | 146.558 | 187.435 | 34.1 | 242 |

## 04. මානව සම්පත්:

2021 වසර අවසානයේදී අධිකාරියෙහි කාර්ය මණ්ඩලය වෘත්තිකයන්ද ඇතුළුව 246 ක් විය. අඛණ්ඩ වෘත්තීයමය සංවර්ධනය වසර පුරාම සිදු කරන ලදි. කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සඳහා වර්ෂය තුල රුපියල් 408,925/- ක පිරිවැයක් දරා තිබුණි.

## 05. බලපත්‍ර නිකුත් කිරීම :

මැණික් කර්මාන්තය සඳහා අධිකාරියෙහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් සහ ප්‍රාදේශීය කාර්යාල මගින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පසුගිය වසර පහක සංඛ්‍යා සමග සසඳා පහත දැක්වේ.

| | **2016** | **2017** | **2018** | **2019** | **2020** | **2021** |
|---|---|---|---|---|---|---|
| මැණික් ගැරීමේ බලපත්‍ර | 5,240 | 4,817 | 5,532 | 5,203 | 4,665 | 4,434 |
| මැණික් වෙළද බලපත්‍ර | 6,102 | 5,328 | 4,795 | 5,449 | 3,481 | 3,628 |
| මැණික් කැපීමේ බලපත්‍ර | 243 | 225 | 211 | 203 | 146 | 120 |
| මැණික් වෙන්දේසි බලපත්‍ර | 491 | 461 | 415 | 684 | 388 | 444 |
| බලපත්‍ර එකතුව | **12,076** | **10,831** | **10,953** | **11,539** | **8,680** | **8,626** |

## 06. අනවසර මැණික් ගැරීම් සහ පාරිසරික හානි පාලනය :

අනවසර මැණික් ගැරීම් සහ ඒ තුළින් සිදුවන පාරිසරික විනාශයන් මැඩපැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය වැටලීම් ගණනාවක් සිදුකරන ලදී. දඩගැසීම් තුළින් රුපියල් මිලියන 10.648 ක ආදායමක් උපයා ගන්නා ලදී.

## 07. විශේෂ මැණික් ගැරීමේ ව්‍යාපෘති:

අධිකාරිය විසින් වර්ෂය තුළදී හැරණියාවක, බඩල්කුඹුර(දෙවන අදියර),මවුන්ට්ජීන් සහ නම්මුනියාවත්ත මැණික් ගැරීමේ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. රුපියල් මිලියන 12**5** ක එකවර ලද අදායමක් හැරණියාවක ව්‍යාපෘතියෙන් ද මිලියන 19.1 ක අදායමක් මැණික් ගල් විකිණීමෙන් ද වර්ෂය තුළදී උපයා ගන්නා ලදී.

## 08. 2021 අපනයන ප්‍රවර්ධන සහ ප්‍රචාරක කාර්යයන්:

1. අපනයනකරුවන්ට විදේශ ප්‍රදර්ශන වලට සහභාගීවීම සඳහා වීසා නිර්දේශ නිකුත් කිරීම.
2. මැණික් සහ ස්වර්ණාභරණ අංශයේ නියැලී සිටින සේවකයින්ගේ ඉල්ලීම මත ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට වීසා නිර්දේශ ලිපි නිකුත් කිරීම.
3. අනෙකුත් නිෂ්පාදන රටවලින් අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා විදේශ ව්‍යවහාර මුදල් (ඇමරිකන් ඩොලර් 50,000 ට අඩු) බැංකුවෙන් ලබා ගැනීම සඳහා නිර්දේශ නිකුත් කිරීම.
4. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල අතර ප්‍රවර්ධන අත් පත්‍රිකා බෙදා හැරීම.
5. 2021 ඔක්තෝබර් 31 වන දිනට ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය අනුග්‍රහය මත පවත්වා ගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ මැණික් සහ ස්වර්ණාභරණ ගැලරිය ලෙස "ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ හුවමාරුව" - SLGJE කළමනාකරණය කිරීම.
6. ඇහැලියගොඩ NGJA ගොඩනැගිල්ලේ මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳ ගැලරිය (වෙළඳසැල් ගණන 13 ක් ඇතුළුව) ස්ථාපිත කර මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳුන් සඳහා වෙළඳසැල් භාර දෙන ලදී.
7. ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ප්රවර්ධනය කිරීම සඳහා ප්‍රවර්ධන වීඩියෝ සකස් කරන ලද අතර (ශ්‍රී ලංකාවේ මැණික්, ස්වර්ණාභරණ ශිල්පීය, NGJA මැණික් පරීක්ෂණ රසායනාගාරය, NGJA තක්සේරු කාර්යාලය සහ ශ්‍රී ලංකා මැණික් සහ ස්වර්ණාභරණ හුවමාරුවේ) සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ ආගමන ප්‍රදේශවල ප්‍රචාරණය කරන ලදී.
8. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික ස්වර්ණාභරණ මෝස්තර අත් පොත (Coffee table book) සකස් කිරීම.
   - ස්වර්ණාභරණ නිර්මාණ එකතු කිරීම සඳහා ප්‍රචාරණ කටයුතු සිදු කර ඇත
   - කමිටුව හරහා ස්වර්ණාභරණ නිර්මාණ තෝරා ගන්නා ලදි
   - තෝරාගත් නිර්මාණ සංවර්ධනය කිරීම සඳහා නිර්මාණකරුවන් වෙත යොමු කරන ලදි
   - කමිටුව හරහා සංවර්ධිත නිර්මාණ ඇගයීම සිදු කරන ලදි
9. ලක්සල ආයතනයේ මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා “ලක්සල” සහ NGJA කළමනාකාරීත්වය සමඟ රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීම.
10. රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, රුසියානු ස්වර්ණාභරණ වෙළඳාම සහ මැණික් වෙළෙඳ ප්‍රජාව සහ ශ්‍රී ලංකාවේ වෙළෙන්දන් සමඟ zoom තාක්ෂණය ඔස්සේ රැස්වීමක් පැවැත්වීම.
11. දකුණු කොරියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ සහයෝගයෙන්, දකුණු කොරියාව තුළ ශ්‍රී ලාංකීය මැණික් හා ස්වර්ණාභරණ ප්‍රවර්ධනය කිරීම සඳහා

කොරියානු මැණික් වෙළඳ සංගමය (KGTA) සමඟ zoom තාක්ෂණය ඔස්සේ රැස්වීමක් පැවැත්වීම සංවිධානය කර ඉදිරිපත් කිරීමක් ද (presentation) සිදු කරන ලදී.

12. ආර්මේනියානු මැණික් සහ ස්වර්ණාභරණ ගැනුම්කරුවන් සහ ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන් අතර මාර්ග ගත (online) B2B රැස්වීමක් පැවැත්වීමට පහසුකම් සලසා ඇත.

13. ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනවලදී ශ්‍රී ලංකා මණ්ඩප සංවිධානය කිරීම.

   - ඩුබායි World Expo 2020 - 2021 දෙසැම්බර් 06 සිට 2022 ජනවාරි 09 දක්වා

14. ශ්‍රී ලංකාව තුළ ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශන සඳහා පහසුකම් සැලසීම

   - ශ්‍රී ලංකාවේ COVID 19 තත්ත්වය හේතුවෙන් 2021 දී දේශීය ප්‍රදර්ශන සංවිධානය කර නොමැත.

15. NGJA වෙබ් අඩවිය හරහා මාර්ගගත වෙළඳ වේදිකාවක් ස්ථාපිත කර ඇත.

16. මුහුණු පොත (FB පිටුව), Youtube නාලිකාව හරහා ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ (BIA) පැමිණීමේ කවුන්ටරයේ වෙළඳ ප්‍රචාරණයක් සංවිධානය කිරීම.

17. 2021 දෙසැම්බර් 03 වන දින මැණික් හා ස්වර්ණාභරණ නිර්මාණ සහ නිෂ්පාදන සම්මාන උළෙල සංවිධානය කරන ලදී.

18. ජාත්‍යන්තර රැකියා වෙළඳපොලේ ප්‍රමිතීන්ට අනුකූලව මැණික් කැපීමේ කාර්මික ශිල්පීන් NVQ 5 වන මට්ටම දක්වා උසස් කිරීමට පහසුකම් සැලසීම.

   - වෘත්තීය තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය NVQ පාඨමාලාවේ විෂයමාලා සංවර්ධනය සැලසුම් කිරීම සහ සකස් කිරීම

19. ජාත්‍යන්තර රැකියා වෙළඳපොලේ ප්‍රමිතීන්ට අනුකූලව ස්වර්ණාභරණ ශිල්පීන් NVQ මට්ටමට සහ HNDJ වෙත උසස් කිරීමට පහසුකම් සැලසීම.

   - වෘත්තීය තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය NVQ පාඨමාලාවේ විෂයමාලා සංවර්ධනය සැලසුම් කිරීම සහ සකස් කිරීම

20. ස්වර්ණාභරණ නිෂ්පාදන සහ ශිල්පීන් සංගම් පිහිටුවීමට කටයුතු කර ස්වර්ණාභරණ ශිල්පීන්ගේ සංගම් හරහා ඔවුන්ගේ ගැටළු හඳුනා ගැනීමට රැස්වීම් පැවැත්වීම හා ස්වර්ණාභරණ ශිල්පීන් සඳහා පුහුණු ක්‍රියාකාරකම් පැවැත්වීම.

21. ස්වර්ණාභරණ සංගම්වල ලියාපදිංචි ස්වර්ණාභරණ නිෂ්පාදකයින් වෙත බෙදාහැරීම සඳහා ස්වර්ණාභරණ නිෂ්පාදන මෙවලම් මිලදී ගැනීම.

22. මැණික් පතල්කරුවන්ට ආරක්ෂිත අත්පොත හඳුන්වාදීම සහ භාෂා තුනෙන්ම ප්‍රකාශයට පත්කිරීම.

## 09. අනෙකුත් සංවර්ධන කටයුතු

1. ස්වර්ණාභරණ අංශයේ උන්නතිය සඳහා X-ray fluorescent spectroscopy සහ Lacer යන්ත්‍ර වැනි නව යන්ත්‍රෝපකරණ මිලදී ගන්නා ලදී.
2. පතල් කැණීමේ බලපත්‍ර නිකුත් කිරීමේ අරමුණ සඳහා "එක්-නැවතුම් පද්ධතියක්" ("One stop system") පිළිබඳ සංකල්පය සතුටුදායක ලෙස ක්‍රියාත්මක වේ.
3. දෙමුවාවත ජාත්‍යන්තර මැණික් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතින අතර මේ වන විට 40% පමණ අවසන් කර ඇත.

4. වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10ක් සහ විගණන සහ කළමනාකරණ රැස්වීම් 4ක් පවත්වන ලදී.
5. අධිකාරියේ වාහන සදහා වාහන ස්ථානගත කිරීමේ පද්ධතිය හඳුන්වා දී ඇත.
6. ඇළහැර බකමූණ හි උප කාර්යාලයක් වර්ෂය තුළ විවෘත කරන ලදී.
7. මැණික් පතල් කැණීමේ ක්‍රියාවලිය අතරතුර සිදු වූ මරණයක් හේතුවෙන් මැණික් පතල් කම්කරු පවුලකට වන්දි වශයෙන් මැණික් පතල් සුබසාධන අරමුදලින් රුපියල් 750,000/= ක් ගෙවන ලදී. එසේම වෙනත් පතල් කැණීමේ කටයුත්තකදී තවත් පතල් කම්කරුවකුට සුළු තුවාල සිදුවීම මත රු.20,000/= ගෙවා ඇත.

## 10. **මැණික් හා ස්වර්ණාභරණ අපනයනය :**

පසුගිය වසර පහක සහ සමාලෝචිත **2021** වසර තුල ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ අපනයනය පිළිබඳ තත්ත්වය පහත දැක්වෙන සංඛ්‍යා මගින් නිරූපනය වේ:

| | **2016** රු. මිලි. | **2017** රු. මිලි. | **2018** රු. මිලි. | **2019** රු. මිලි. | **2020** රු. මිලි. | **2021** රු. මිලි. |
|---|---|---|---|---|---|---|
| **මැණික් අපනයන** | 20,857 | 21,644 | 22,304 | 19,364 | 13,120 | 21,619 |
| **ස්වර්ණාභරණ අපනයන** | 2,240 | 2,331 | 2,062 | 2,476 | 1,257 | 2,002 |
| **ගෙවුඩ අපනයනය** | 103 | 33 | 19 | 10 | 18 | 27 |
| **දියමන්ති ප්‍රතිඅපනයනය** | 14,967 | 14,134 | 19,393 | 23,670 | 16,321 | 28,291 |
| **දියමන්ති ආභරණ අපනයනය** | 243 | 207 | 190 | 242 | 168 | 356 |
| මුළු අපනයනය | **38,410** | **38,349** | **43,968** | **45,762** | **30,884** | **52,295** |

| | **2016** | **2017** | **2018** | **2019** | **2020** | **2021** |
|---|---|---|---|---|---|---|
| | ඇ.ඩො.මි. | ඇ.ඩො.මි. | ඇ.ඩො.මි. | ඇ.ඩො.මි. | ඇ.ඩො.මි. | ඇ.ඩො.මි. |
| මැණික් අපනයන | 144.17 | 140.27 | 137.60 | 107.21 | 70.62 | 112.19 |
| ස්වර්ණාභරණ අපනයන | 15.15 | 15.09 | 12.61 | 13.73 | 6.74 | 9.96 |
| ගෙවුඩ අපනයන | 0.70 | 0.21 | 0.12 | 0.06 | 0.10 | 0.14 |
| දියමන්ති ප්‍රතිඅපනයන | 101.26 | 91.53 | 118.35 | 131.02 | 92.70 | 140.63 |
| දියමන්ති ස්වර්ණාභරන | 1.64 | 1.34 | 1.17 | 1.34 | 0.90 | 1.78 |
| **මුළු අපනයන** | **262.92** | **248.44** | **269.85** | **253.36** | **171.06** | **264.70** |

තිලක් වීරසිංහ

සභාපති හා ප්‍රධාන විධායක නිලධාරි

**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය** **2022.02.28**

## ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
## 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| | | රු | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 3 | 514,319,798.95 | 484,360,159 |
| කල්බදු ඉඩම් (භාවිතයට අයිති) | 4 | 11,814.70 | 14,179 |
| අනෙකුත් වත්කම් | 7 | 371,939,330.58 | 371,939,331 |
| විකිණිය හැකි මූල්‍ය වත්කම් | 8 | 1,200,010.00 | 1,200,010 |
| කාරක ප්‍රාග්ධන ප්‍රගතිය | | 118,773,637.24 | 14,398,883 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 14 | 26,890,229.05 | 26,890,229 |
| **ජංගම නොවන වත්කම් එකතුව** | | **1,033,134,820.52** | **898,802,791** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 9 | 4,092,574.61 | 2,569,769 |
| ලැබිය යුතු දෑ | 10 | 95,619,502.10 | 63,489,446 |
| කල්පිරෙන තෙක් රඳවා ගත් ආයෝජන (HTM) | 11 | 1,198,624,994.83 | 1,059,635,760 |
| තැන්පත් සහ අත්තිකාරම් | 12 | 177,113,499.39 | 163,481,299 |
| සේවක ණය සහ අත්තිකාරම් | 13 | 15,077,003.37 | 17,942,880 |
| අනිකුත් මූල්‍ය වත්කම් | 14 | 853,929,104.88 | 809,167,232 |
| මුදල් සහ මුදලට සමාන දෑ | 15 | 84,908,410.04 | 54,109,508 |
| **මුළු ජංගම වත්කම් එකතුව** | | **2,429,365,089.22** | **2,170,395,894** |
| **මුළු වත්කම්** | | **3,462,499,909.74** | **3,069,198,685** |
| **ස්කන්ධ(හිමිකම්) සහ බැරකම්** | | | |
| **ස්කන්ධ** | | | |
| භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන දායකය | 16 | 30,000,000.00 | 30,000,000 |
| මැණික් ගැරීමේ සුභසාධක අරමුදල | 17 | 34,154,874.09 | 31,739,874 |
| ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල | 18 | 82,536,818.03 | 81,175,878 |
| මැණික් ත්‍යාග අරමුදල | 19 | 46,594,806.24 | 44,747,558 |
| මැණික් ප්‍රත්‍යාගණන සංචිත | 20 | 355,074,648.00 | 355,074,648 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 21 | 52,945,424.11 | 52,945,424 |
| රඳවා ගත් ඉපයුම් | | **1,150,277,527.87** | **986,087,752** |
| **ස්කන්ධ එකතුව** | | **1,751,584,098.34** | **1,581,771,134** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව | 22 | **45,753,330.68** | 49,841,554 |
| විලම්භිත බදු බැඳියාව | 6 | **24,368,130.77** | 24,644,384 |
| කල් බදු ගෙවීමේ බැඳියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද ඉක්මවන | 23 | **2,742.00** | 3,739 |
| **ජංගම් නොවන බැරකම් එකතුව** | | **70,124,203.45** | **74,489,678** |
| **ජංගම බැරකම්** | | | |
| කල් බදු ගෙවීමේ බැඳියාව - පියවීමේ කාලසීමාව අවුරුද්ද නොඉක්මවන | 23 | 1,668.00 | 1,450 |
| ගෙවිය යුතු දෑ | 24 | 213,550,981.05 | 200,158,800 |
| මැණික් ගැරීමේ තැන්පතු | | 840,553,983.32 | 707,809,372 |
| තැන්පත් සහ ලැබූ අත්තිකාරම් | 25 | 115,846,059.77 | 132,465,919 |
| ව්‍යවස්ථාපිත ගෙවීම් | 26 | 392,510,500.15 | 299,958,339 |
| වෙන්කිරීම් සහ උපචිත වියදම් | 27 | 78,328,415.66 | 72,543,993 |
| **ජංගම බැරකම් එකතුව** | | **1,640,791,607.95** | **1,412,937,873** |
| **ස්කන්ධ සහ බැරකම් එකතුව** | | **3,462,499,909.74** | **3,069,198,685** |

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයන්ට අනුව මෙම මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කර ඇති බවට අධ්‍යක්ෂ මූල්‍ය සහතික කරයි.

**---------------------------------**

**අධ්‍යක්ෂ මූල්‍ය**

**පිටු 16 - 27 හි ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 28 - 42 පිටුවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 මාර්තු 04 වැනි දින අනුමත කරන ලදී.**

.................................................

**සභාපති/ ප්‍රධාන විධායක නිලධාරි**

**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | සටහන් | 2021<br>රු. ශත | 2020<br>රු. ශත |
|---|---|---|---|
| අයභාරය | **28** | 525,887,827.96 | 284,970,694 |
| අනෙකුත් ආදායම් | **29** | 21,719,148.19 | 26,396,677 |
| පරිපාලන වියදම් | **30** | (179,454,720.45) | (140,650,673) |
| සේවක වියදම් | **31** | (242,186,325.93) | (251,282,525) |
| ප්‍රවර්ධන වියදම් | **32** | (12,903,628.29) | (1,818,522) |
| මෙහෙයුම් ලාභය | | **113,062,301.48** | **(82,384,350)** |
| ශුද්ධ මූල්‍ය ආදායම | **33** | **128,960,706.39** | 116,496,976 |
| ශුද්ධ මූල්‍ය ආදායමට පසු ලාභය | | **242,023,007.87** | **34,112,626** |
| බදුවලට පෙර ලාභය | | **242,023,007.87** | **34,112,626** |
| **ආදායම් බදු වියදම්** | **34** | (37,650,618.73) | (8,535,016) |
| වර්ෂය සඳහා ලාභය | | **204,372,389.14** | **25,577,610** |
| වර්ෂය සඳහා ලාභය | | 204,372,389.14 | 25,577,610 |
| වෙනත් විස්තීරණ ආදායම් | | | |
| අඩුකලා: | | - | - |
| ඒකාබද්ධ අරමුදලට දායකය | | (40,000,000.00) | (21,379,019.36) |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම්** | | **164,372,389.14** | **4,198,591** |

## ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| | 2021 | 2020 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| **බදු වලට පෙර ලාභය** | **242,023,008** | **34,112,626** |
| **ගැලපීම්** | | |
| ක්ෂයවීම් | 34,431,461 | 27,218,459 |
| විශ්‍රාම පාරිතෝෂික බැඳීම් සඳහා වෙන්කිරීම් | 960,314 | 18,577,489 |
| ලාභාංශ | - | (500,000) |
| පොලී ආදායම් | (128,999,414) | (116,535,551) |
| කල්බදු ගෙවීම් බැඳීම් වලදී ඇතිවූ මූල්‍ය පිරිවැය | 38,708 | 38,575 |
| භාවිතයට අයිති ඉඩම් වල ක්‍රමක්ෂය | 2,364 | 2,364 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය** | **148,456,440** | **(37,086,039)** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්** | | |
| තොග | (1,522,805) | 107,748 |
| ලැබිය යුත දෑ | (32,130,057) | 60,114,638 |
| තැන්පතු සහ අත්තිකාරම් | (13,632,200) | (118,195,018) |
| සේවක ණය සහ අත්තිකාරම් | 2,865,876 | (482,844) |
| ගෙවිය යුතු දෑ | 13,392,181 | 104,870,034 |
| මැණික් ගැරීමේ තැන්පතු | 132,744,612 | 71,194,875 |
| තැන්පතු සහ අත්තිකාරම් ලැබීම් | (16,619,859) | (368,589) |
| වෙන් කිරීම් සහ උපචිත වියදම් | 5,784,423 | 1,108,463 |
| **මෙහෙයුම් වලින් ජනිත මුදල්** | **239,338,611** | **81,263,268** |
| පාරිතෝෂික ගෙවීම් | (3,655,248) | (4,120,553) |
| ගෙවූ බදු | (16,480,089) | (6,000,000) |
| **මෙහෙයුම් වලින් ජනිත ශුද්ධ මුදල්** | **219,203,274** | **71,142,715** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනිතවූ මුදල් ප්‍රවාහය** | | |
| යන්ත්‍ර පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම | (64,866,955) | (57,010,877) |
| ලාභාංශ ලැබීම් | - | 500,000 |
| අනිකුත් මූල්‍ය වත්කම් වල ශුද්ධ ආයෝජනයන් | (185,000,000) | (59,061,901) |
| භාණ්ඩාගාර බිල්පත් වල ශුද්ධ ආයෝජන | (38,006,353) | (53,152,623) |
| පොලී ලැබීම් | 93,872,073 | 82,540,866 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනිත (භාවිතා කරන ලද) ශුද්ධ මුදල්** | **(194,001,235)** | **(86,184,535)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහ** | | |
| මැණික් ගැරීමේ සුභසාධක අරමුදල් උපයෝජනය | 2,415,000 | 1,372,050 |
| කල්බදු සඳහා වූ වගකීම් සමථය | (26,325) | (26,325) |
| ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලට දායකය | 1,360,940 | 5,107,973 |
| මැණික් ත්‍යාග අරමුදලට දායකය | 1,847,248 | (1,646,540) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් (භාවිත)** | **5,596,863** | **4,807,158** |
| මුදල් සහ මුදල් සමානයන් ශුද්ධ වෙනස්වීම | **30,798,902** | **(10,234,662)** |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදලට සමානයන් | **54,109,508** | **64,344,170** |
| වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමානයන් (සටහන 15) | **84,908,410** | **54,109,508** |

## ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්

### 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 1.1 පිළියෙල කිරීමේ පදනම

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙහි (“අධිකාරිය”) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූලව පිළියෙල කර ඇත. මූල්‍ය වත්කම් ඒවායේ ඓතිහාසික පිරිවැය, ඒවායේ විකුණුම් මත ලබා ගත හැකි සත්‍ය වටිනාකමට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. සමහර ගැටලු සහගත ගිණුම් ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතයන්වල (SLFRSs) නියම කර ඇති කරුණු වලට එකඟව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරේ. ගිණුම්කරණ ප්‍රමිත අදාල කර ගැනීමේ ක්‍රියාවලියේදී කළමනාකාරිත්වය සිය විනිශ්චය ක්‍රියාත්මක කිරීම ද අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ විනිශ්චයන් හෝ සංකීර්ණත්වය සම්බන්ධ ක්ෂේත්‍ර හෝ මූල්‍ය ප්‍රකාශන සඳහා වැදගත් වන උපකල්පන සහ ඇස්තමේන්තු ක්ෂේත්‍ර අනාවරණය කෙරේ.

### 1.2 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්

අනෙකුත් විදියකින් දක්වා නොමැති නම් පහත සඳහන් කර ඇති ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට පරිවර්තනය කිරීම ආරම්භක දිනයට පැවති මූල්‍ය තත්ත්වය ඉදිරිපත් කරන ලද කාලපරිච්ඡේද වලට අදාලව සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන වල ස්ථිරව යොදාගෙන ඇත.

මෙම වර්ෂයේදී මනා ලෙස ඉදිරිපත් කිරීම සහ සැසඳීමට හැකිවන පරිදී අවශ්‍ය අවස්ථා වලදී පසුගිය වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කර ඇත.

### 1.3 විදේශීය මුදල් පරිවර්තනය කිරීම

#### 1.3.1 ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය සහ ක්‍රියාකාරීත්වය

මූල්‍ය ප්‍රකාශයන්හි අඩංගු ගණුදෙණු සහ ශේෂයන් ආයතනය ක්‍රියාත්මක වනු ලබන මූලික ආර්ථික පරිසරයේදී භාවිතා කරනු ලබන මුදල් මත ගණනය කර ඇත. අධිකාරියෙහි මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කර ඇත.

#### 1.3.2 ගණු දෙණු සහ ශේෂයන්

විදේශීය මුදල් ගණුදෙණු එකී ගණුදෙණුව සිදුවන අවස්ථාවේ පවතින විදේශ මුදල් හුවමාරු අනුපාතයන් භාවිතා කරමින් ක්‍රියාකාරීත්වයේ පවතින මුදල් වලට පරිවර්තනය කරනු ලැබේ. එකී ගණුදෙණු පියවීමේදී ඇතිවන විදේශ මුදල් හුවමාරු ලාභය හෝ අලාභය සහ වර්ෂය අවසානයේ පරිවර්තනයන් එදිනට පවතින විදේශ මුදල් හුවමාරු වටිනාකම මත මූල්‍ය වත්කම් සහ විදේශ මුදල් මත ඇතිවන බැදීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හි හඳුනා ගැනේ.

ක්‍රමක්ෂය පිරිවැය වෙනස්වීම් වලට අදාල මුදල් පරිවර්තිත වෙනස්වීම් විස්තීරණ ආදායම් ප්‍රකාශන වලදී හඳුනා ගැනේ.

### 1.3.3 **දේපල, පිරියත හා උපකරණ**

කළමනාකාරීත්වය අදහස් කරන පරිදී වත්කම් යම් ස්ථානයක පිහිටුවීමට හෝ ක්‍රියාකාරීත්වයට ගෙන ඒමට දරනු ලබන ඍජුවම ආරෝපිත කළ හැකි ඕනෑම පිරිවැයක් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකමට ඇතුළත්ව හඳුනාගැනේ.

1998 වර්ෂයට පෙර අත්පත් කරගත් දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන වටිනාකමට පිළියෙල කර ඇත. ප්‍රත්‍යාගණන වටිනාකම ප්‍රත්‍යාගණනය කරනු ලබන දිනයේදී පැවති සාධාරණ වටිනාකමට පුළුල් ලෙස සැසඳිය හැකි බැවින් අධිකාරිය විසින් නැවත ප්‍රත්‍යාගණන ලද දිනයේදී සලකා බලන ලද පිරිවැය ලෙස නැවත තක්සේරු කළ මුදල තෝරාගෙන ඇත. දේපළ, පිරියත හා උපකරණ පිරිවැය සමුච්චිත ක්ෂවීම් සහ හානිකරන පාඩු අඩුකිරීමෙන් පසුව සටහන් කරනු ලැබේ. 1998 වර්ෂයෙන් පසුව අත්පත් කරගන්නා ලද දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරන පාඩු අඩු කිරීමෙන් පසුව ලෙස ගණනය කරනු ලැබේ.

වත්කමක් මිලදී ගැනීමෙන් පසුව දරනු ලබන පිරිවැය එම අයිතමය මගින් අධිකාරියට ගෙනදෙන අනාගත ආර්ථික වාසි සමග ඒකාබද්ධව විශ්වාසයකින් ගණනය කල හැකි නම් එයද වත්කමෙහි වටිනාකම ලෙස හඳුනාගනු ලබන අතර, අනෙකුත් සියලුම අලුත්වැඩියා සහ නඩත්තු සඳහා දරනු ලබන ගාස්තු එකී වියදම දරනු ලබන කාලපරිච්චේදයට අදාළ විස්තීරණ ආදායම් ප්‍රකාශන වල දක්වනු ලැබේ.

කොළඹ 03, අංක 25, ගාලු මුවදොර ටෙරස් හි පිහිටි ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට ආසන්නයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම හේතුවෙන් ඉහත ප්‍රධාන කාර්යාල පරිශ්‍රයට හානි සිදුවී ඇත.
හානිය තක්සේරු කිරීම සඳහා විශේෂඥ සේවා ලබා ගැනීම මොරටුව විශ්වවිද්‍යාලයට පවරා ඇති අතර වාර්තාව ලැබීමෙන් පසු ගොඩනැගිල්ලේ ධාරණ වටිනාකම සකසනු ලැබේ.

ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර අනෙකුත් වත්කම් සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කරනු ලබන අතර පහත සඳහන් අයුරු වත්කමෙහි ඇස්තමේන්තුගත ජීව ආයුකාලය මත එහි ක්ෂයවීම් බෙදාහරිනු ලැබේ.

| අයිතම වර්ගය | අනුපාතය | |
|---|---|---|
| ගොඩනැගිලි | වසර 30-50 | 2% - 3.33% |
| බෙදා වෙන්කිරීම් | වසර 3 | 33.33 % |
| පර්යේෂණාගාර හා ස්වර්ණාභරණ පරික්ෂණ උපකරණ | වසර 10 | 10% |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | වසර 10 | 10% |
| මෝටර් වාහන | වසර 4 | 25% |
| පරිගණක උපකරණ | වසර 5 | 20% |
| අනෙකුත් වත්කම් | වසර 10 | 10% |

වත්කමෙහි ඇස්තමේන්තුගත වටිනාකමට වඩා ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම වැඩිවන්නේ නම්, වත්කමෙහි ඉදිරියට ගෙන එන වටිනාකම පියවාගත හැකි වටිනාකමට ලියා හරිනු ලැබේ.

### 1.3.4. අස්පෘශ්‍යා වත්කම්

පරිගණක වැඩසටහන් හා පරිගණක පද්ධති අත්පත් කරගැනීමට හා ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට ගෙන ඒම සඳහා දරනු ලබන පදනම මත පරිගණක වැඩසටහන් හා පරිගණක පද්ධති ප්‍රාග්ධනීත කරනු ලැබේ. මිලදී ගත් අස්පෘශ්‍යා වත්කම් ඒවා මිලදී ගැනීමට දරන ලද වියදමෙන් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානි වූ වටිනාකම අඩුකිරීමෙන් පසු දක්වනු ලැබේ. මෙම පිරිවැය පහත සඳහන් අයුරු ඇස්තමේන්තු ගත ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| පරිගණක පද්ධති | වර්ෂ 5 | 20% |

පරිගණක පද්ධති නඩත්තු සඳහා දරනු ලබන පිරිවැය වියදම් වශයෙන් හඳුනා ගනු ලැබේ.

### 1.3.5. කල් බදු ඉඩම්

බදු යටතේ පවතින ඉඩම මුලින් මනිනු ලබන්නේ බදු ගෙවීම් වටිනාකම වර්ධනය වන ණය අනුපාතයන් යටතේ වට්ටම්කර එයට ආරම්භක මූලික පිරිවැය හා ඉන් පසුව දරන්නට සිදුවන පිරිවැය එකතුකර වර්තමාන වටිනාකම සමාන වන පරිදි ගණනය කරනු ලබන අතර කල්බදු ඉඩම් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කරනු ලැබේ. කල්බදු ඉඩම් වල වටිනාකම කල් බදු කාලසීමාව තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| කල් බදු ඉඩම් | වර්ෂ 30 | 3.33% |

### 1.3.6. මූල්‍ය නොවන වත්කම් වල හානිකරන පාඩු

සෑම වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය විසින් දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍යා වත්කම්වල අගය හානි වීමක් පෙන්නුම් කෙරේද යන්න තීරණය පිළිබඳ විමසා බැලීමට එම වත්කම්වල අගය සමාලෝචනය කරයි. එවැනි ලක්ෂණයක් පෙන්නුම් කෙරේ නම්, එම වත්කම් මගින් ආවරණය කරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කර හානි පාඩු ප්‍රමාණය තීරණය කෙරේ.

අයකරගත හැකි මුදල යනු විකිණීමට සහ භාවිතයේ ඇති වටිනාකමට වඩා වැඩි සාධාරණ වටිනාකමකි. භාවිතා කිරීමේ අගය ඇස්තමේන්තු කිරීමේදී, අනාගත අස්තමේන්තුගත මුදල් ප්‍රවාහ වර්තමාන මුදල් ප්‍රවාහ වර්තමාන වටිනාකම අනාගත බදු වට්ටම් අනුපාතයෙන් ගණනය කරන අතර එම මුදල් වල වර්තමාන තක්සේරු අගය හා විශේෂ අවදානම් තක්සේරු කරනු ලැබුවද එය අනාගත මුදල් ප්‍රවාහයට ගැලපීම් නොකෙරේ.

අයකරගත හැකි මුදල යනු විකිණීමට සහ භාවිතයේ ඇති වටිනාකමට වඩා වැඩි සාධාරණ වටිනාකමකි. භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ බදු වලට පෙර වට්ටම් අනුපාතයක් භාවිතා කරමින්ය. එය මුදල්වල කාල වටිනාකමෙහි වර්තමාන වෙළඳපොල තක්සේරු කිරීම් සහ අනාගත මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරන වත්කමට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරයි.

වත්කමෙහි දරනු ලබන වටිනාකම ආවරණය කරගත හැකි ඇස්තමේන්තු වටිනාකමට අඩුනම්, ධාරණ වටිනාකම ආවරණය කරගත හැකි වටිනාකම දක්වා වත්කමෙහි වටිනාකම අඩු කරනු ලැබේ. හානි පාඩු විස්තීර්ණ මුදල් ප්‍රකාශයන්හිදී හඳුනාගනු ලැබේ.

## 1.4. **මූල්‍ය වත්කම්**

### 1.4.1. වර්ගීකරණය

(අ) අධිකාරිය එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය මූලික හඳුනාගැනීමේදී තීරණය කරන අතර එහි මූල්‍ය වත්කම් පහත පරිදි වර්ග කරයි:

i. ණය හා ලැබිය යුතු දෑ
ii. විකිණීමට හැකි දෑ (AFS)
iii. කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන(HTM)

**i. ණය හා ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රීය වෙළඳපොලක සඳහන් කර නොමැති ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය ඉක්මවා මාස 12 ට වැඩි කාලයකින් කල් ඉකුත් වන දෑ හැර අනෙකුත් ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම් වල ඇතුලත්ව ඇත. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදය අවසානයේ අධිකාරියෙහි පැවති වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ, රාජ්‍ය සුරැකුම් පත් නැවත මිලදී ගැනීම්, තැන්පත්, සේවක ණය හා මුදල් සහ මුදල් සමාන දෑ වලින් ණය හා ලැබිය යුතු දෑ සමන්විත වේ.

**ii.** **විකුණාගත හැකි දෑ (AFS)**

මෙකී වර්ගයට නියම කරන ලද හෝ වෙනත් කිසිදු වර්ගයකට වර්ගීකරණය නොකරන ලද නමුත් පැවත එන මූල්‍ය වත්කම් විකිණිය හැකි ආයෝජන යටතට ගැනේ. වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයෙන් පසු මාස 12 ක් තුළ විකිණීමට තීරණය නොකරන ලද හෝ කල් පිරෙනු ලබන ජංගම වත්කම් ගණයට නොවැටෙන දේ මෙයට ඇතුළත්වේ. විකිණිය හැකි මූල්‍ය වත්කම් දිගුකාලීන ලැයිස්තුගත නොවූ ස්කන්ධ ආයෝජනවලින් සමන්විත වේ.

**iii.** **කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන (HTM)**

HTM ආයෝජන යනු ණය සහ ලැබිය යුතු දේ හැර ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීමක් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. අධිකාරියට ධනාත්මක චේතනාවක් සහ පරිණත වන තෙක් තබා ගැනීමට හැකියාවක් තිබේ නම්, HTM ආයෝජන ලෙස වර්ග කෙරේ.

ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කරනු ලබන වාර්තා කරන කාල පරිච්ඡේදය අවසන් වීමෙන් පසු මාස 12කට අඩු කාලයක් ඉක්මවී කල් පිරෙනු ලබන HTM ආයෝජන ජංගම වත්කම්වල ඇතුළත් කෙරේ. අධිකාරිය දැනට භාණ්ඩාගාර බිල්පත් වල කර ඇති ආයෝජන මේ යටතට ගැනේ.

### 1.4.2 හඳුනා ගැනීම් සහ මූලික ගණනය කිරීම්

මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු මුදල් ලෙස වර්ගීකරණය කරන අතර අධිකාරිය විසින් ගනුදෙනුව ආරම්භ කළ දිනයේ පිළිගනු ලැබේ. අධිකාරිය මූල්‍ය ලේඛනයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශ්වකරුවෙකු බවට පත්වන වෙළඳ දිනයේදී අනෙකුත් මූල්‍ය වත්කම් පිළිගනු ලැබේ.

මූල්‍ය වත්කමක් මූලික ලෙස මනිනු ලබන්නේ සාධාරණ වටිනාකම මත වන අතර සාධාරණ වටිනාකමක් නොමැති වත්කම් සම්බන්ධයෙන් ලාභය හෝ අලාභය හරහා ඍජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයෙනි.

මූල්‍ය වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත් වූ විට හෝ මාරු කර ඇති විට සහ අධිකාරිය විසින් මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ත්‍යාග සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට මූල්‍ය වත්කම් හඳුනා ගනු නොලැබේ.

### 1.4.3 දෙවනුව ගණනය කිරීම්

i. **ණය සහ ලැබිය යුතු දෑ**

මූලික හඳුනා ගැනීමෙන් පසුව ණය හා ලැබිය යුතු දෑ ඵලදායි පොලී ක්‍රමය භාවිතා කරමින් හානි හා පාඩු සඳහා වෙන් කිරීම් අඩුකර ක්‍රමක්ෂ වියදම් මත ගණනය කෙරේ.

ii. **විකිණිය හැකි දෑ (AFS)**

මූලික හඳුනා ගැනීමෙන් පසුව ලැයිස්තු ගත නොවූ ආයෝජන විකුණා ගත හැකි මූල්‍ය වත්කම් ලෙස වර්ග කෙරෙන අතර එහි වර්තමාන සාධාරණ වටිනාකම නියත වශයෙන් ඇස්තමේන්තු කල නොහැකි විට පිරිවැයෙන් හානිකරන අලාභය අඩු කිරීමෙන් ගණනය කරනු ලැබේ.

iii. **කල්පිරීම දක්වා රඳවා ගන්නා වූ ආයෝජන(HTM)**

කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය මත, ඵලදායි පොලී ක්‍රමය භාවිතා කරමින් වූ ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේදී හා හුවමාරු පිරිවැය මත වට්ටම් සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීම් සහ ගනුදෙනු පිරිවැය මත වට්ටම් හෝ වාරික සැලකිල්ලට ගනිමින් ක්ෂය පිරිවැය ගණනය කෙරේ.

1.4.4 **මූල්‍ය වත්කම් වල හානිකරන පාඩු**

I. **වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැය මත දැක්වීම**

මූල්‍ය වත්කම් වල වටිනාකම හානි වී තිබෙන බවට පිළිගත හැකි සාක්ෂි තිබේ නම් වාර්තා කරනු ලබන සෑම කාල පරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය විසින් තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කමක අගය අඩුවී තිබේනම් එම හානි වීමෙන් සිදුවූ අඩුවීම අඩංගුව ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේ නම්ද, වත්කමක් මූලික හඳුනා ගැනීමෙන් පසු සිද්ධීන් එකක් හෝ කිහිපයක ( 'අහිමි සිදුවීමක්' ) ප්‍රතිඵලයක් ලෙස එය ඇතිවී ඇත්නම් සහ එකී පාඩු අවස්ථාව හෝ අවස්ථාවන් (හෝ සිදුවීම්) අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන්ට බලපෑමක් සිදු කෙරෙන විට එය පිළිගත හැකි ලෙස ඇස්තමේන්තු කෙරේ.

ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ ණය සහ ලැබිය යුතු දෑ සහ කල් පිරෙන ආයෝජන සඳහා, අලාභයේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ධාරණ වටිනාකම සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනස අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම ( ඇතුලත් නොවූ අනාගත බැර පාඩු හැර) අනුව අලාභය ගණනය කර එම මූල්‍ය වත්කම්වල මූල්‍ය ඵලදායි පොලී අනුපාතයට වට්ටම් කිරීමෙනි. මූල්‍ය වත්කම්වල ධාරණ වටිනාකම අඩු කරන අතර අලාභයේ ප්‍රමාණය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගැනේ.

පසුකාලීන කාල පරිච්ඡේදයකදී, හානිකරණ පාඩුවේ වටිනාකම අඩු වන්නේ නම්ද අඩුවීම සහ හානිකරන පාඩුව හඳුනා ගැනීමෙන් පසු සිදුවන සිදුවීමකට සම්බන්ධ නම් හඳුනාගත් හානිකරන පාඩුව ආපසු හැරවීම විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

II **විකිණිය හැකි දැ (AFS)**

මූල්‍ය වත්කමකට හානි සිදුවී ඇති බවට පිළිගත හැකි සාක්ෂි තිබේනම් වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම අධිකාරිය එය තක්සේරු කරනු ලැබේ. ලැයිස්තුගත නොකළ හිමිකම් (ස්කන්ධ) ආයෝජනයන් සඳහා, ආයෝජනයන්ගේ වටිනාකම සැලකිය යුතු හෝ දිගින් දිගටම පිරිහීම පිළිබඳ සාක්ෂි ඇත්නම් වත්කම්වල අගය අඩු කරනු ලැබේ. මිල ගණන් ප්‍රකාශයට පත් නොකළ ආයෝජනයන් සඳහා එවැනි සාක්ෂි තිබේනම්, මූල්‍ය වත්කමේ ධාරණ වටිනාකම සහ වෙනත් එවැනි වත්කමක් සඳහා වර්තමාන ඉපයීම් වෙළඳපොල අනුපාතය මගින් අනාගත ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් ලැබෙන වර්තමාන අගය අතර වෙනස ගණනය කර හානිකරන පාඩුව ගණනය කරනු ලැබේ. එවැනි හානිකරන පාඩු යථා තත්ත්වයට පත් කරනු නොලැබේ.

## 1.5 භාණ්ඩ තොග

තොග අගය කරනු ලබන්නේ අඩු පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය අනුව ය. පිරිවැය තීරණය කරනු ලබන්නේ පෙර පිවිසි පෙරනිකුතු ක්‍රමය අනුවය. පාරිභෝගික භාණ්ඩ සහ ලිපිද්‍රව්‍ය වලින් තොග සමන්විත වේ.

## 1.6 ලැබිය යුතු දැ

ලැබිය යුතු දැ මුලින්ම එහි සත්‍ය වටිනාකම් මත (ඉන්වොයිස් අගය) හඳුනා ගන්නා අතර, ඉන් පසුව හිඟ මුදල් කෙටි කාලයක් තුළ ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන බැවින් සත්‍ය වටිනාකම් (ඉන්වොයිස් අගය) සලකා එයින් හානි සඳහා අඩු කිරීමද සිදු කරන අතර, මුදල් වල කාලීන වටිනාකම සැලකිල්ලට නොගැනේ.

වාර්තා කරනු ලබන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම ආපසු ලැබිය යුතු දැ වල හානිවලට අදාළ සාක්ෂි තිබේදැයි අධිකාරිය විසින් තීක්ෂණව තක්සේරු කරනු ලැබේ. ලැබිය යුතුදැ වල හානි කරන පාඩුවේ අධිකාරියෙහි පසුගිය මුදල් එකතු කිරීමේ අත්දැකීම් සහ ලැබීම් ප්‍රමාද සංඛ්‍යාව ඇතුළත් වේ. ලැබිය යුතු දැ වල හානි සහ හානිකරන පාඩුව පිළිබඳ සාක්ෂි තිබේනම් ලැබිය යුතු දැ හානි පාඩු සඳහා වෙන වෙනම තක්සේරු කරනු ලැබේ.

## 1.7 මුදල් හා මුදලට සමාන දැ

මුදල් හා මුදලට සමාන දැ තුළ අතැති මුදල්, බැංකු ඒක්ෂණ තැන්පතු, මාස තුනක් හෝ ඊට පෙර කල් පිරෙනු ලබන ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඇතුළත් කර ඇත.

## 1.8 දායකත්ව ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයන් මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනය වේ.

## 1.9 මූල්‍ය බැරකම්

අධිකාරියෙහි මූල්‍ය බැරකම් අනෙකුත් මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. අධිකාරියෙහි අනෙකුත් මූල්‍ය බැරකම් වලට ගෙවිය යුතු දෑ, බලපත්‍ර සඳහා ලැබූ අත්තිකාරම්, මැණික් ගැරීමේ තැන්පතු හා අනෙකුත් තැන්පත් ලැබීම් ඇතුළත්වේ. සාධාරණ වටිනාකම සහ සෘජුව ආරෝපණය කළ හැකි ඕනෑම ගනුදෙනු පිරිවැය මත අනෙකුත් මූල්‍ය බැරකම් මූලිකව හඳුනා ගැනේ. මූලික හඳුනාගැනීමෙන් පසුව කෙටි කාලයක් තුළදී ආපසු ගෙවීමට බලාපොරොත්තුවන හිඟ මුදල්වල මූලික වටිනාකම අනුව ගණනය කර හඳුනා ගැනීම සිදුකෙරේ.

කල් ඉකුත්වීම, අවලංගු කිරීම, ගිවිසුම් ගත බැඳීම් වලින් නිදහස් වීම වැනි අවස්ථා වලදී අධිකාරිය මූල්‍ය බැරකම් ඉවත් කෙරේ.

## 1.10 ප්‍රවර්තන හා විලම්භිත බදු

කාල පරිච්ඡේදය තුළ දරන ලද බදු වියදම් වල ප්‍රවර්තන හා විලම්භිත බදු අඩංගුවේ. වෙනත් විස්තීරණ ආදායම්වල පිළිගත් අයිතමවලට අදාළ ප්‍රමාණයට හැර විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ බද්ද හඳුනාගෙන ඇත. මෙහිදී, බද්ද වෙනත් විස්තීර්ණ ආදායමකින් ද හඳුනා ගැනේ. වත්මන් ආදායම් බදු ගණනය කරනු ලබන්නේ අධිකාරියට ක්‍රියාත්මක වීමට සහ බදු අය කළ හැකි ආදායම් උත්පාදනය කිරීමට අදාළ වාර්තාකරණ කාල සීමාවේදී පනවන ලද බදු නීති මත පදනම්වය. බදු අධිකාරීන්ට ගෙවීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රමාණය අනුව කළමනාකරණය සුදුසු අවස්ථාවලදී ප්‍රතිපාදන ස්ථාපිත කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වත්කම් හා වගකීම්වල බදු පදනම සහ ඒවායේ ධාරණ වටිනාකම මත පැන නගින තාවකාලික වෙනස අනුව විලම්භිත බදු හඳුනාගැනේ. ගනුදෙනුව සිදුවන අවස්ථාවේ ගිණුම්කරණයට හෝ බදු ගෙවිය හැකි ලාභයක් හෝ අලාභයක් බලපාන්නේ නැති ව්‍යාපාරික සංයෝජනයක් හැර වෙනත් ගනුදෙනුවක වත්කම් හා වගකීම් සම්බන්ධ ගණුදෙණු සිදුවන අවස්ථාවලදී විලම්භිත බදු ගිණුම් ගත නොකෙරේ. කාල පරිච්ඡේදය අවසන් වන දිනයට බල පවත්වන බදු අනුපාතයන් භාවිතයෙන් විලම්භිත බදු තීරණය කරන අතර අදාළ විලම්භිත බදු වත්කම් සාක්ෂාත් කරගත් විට හෝ විලම්භිත ආදායම් බදු වගකීම පියවූ විට විසඳා ගැනීමට අපේක්ෂා කෙරේ.

විලම්භිත බදු හඳුනාගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් භාවිතා කළ හැකි අනාගත බදු අය කළ හැකි ලාභය ලබා ගත හැකි ප්‍රමාණයට පමණි.

අනාගත බදු වත්කම් හා වගකීම් වර්තන බදුවලට එරෙහිව හිලව් කිරීම සඳහා නීතිමය බලාත්මක අයිතියක් තිබේනම්, බදු අධිකාරීන් විසින් ආදායම් බදු පැනවීමේදී ඒ හා සම්බන්ධවේ නම් විලම්භිත බදු වගකීම් වර්තන බදු වගකීම් වලට එරෙහිව ලියා හැරේ.

## 1.11 සේවක ප්‍රතිලාභ

### (අ) නිර්වචිත දායකත්ව සැලසුම

සේවය අවසන් කිරීමේදී ගෙවනු ලබන ප්‍රතිලාභ සැලැස්මක් වන අතර අධිකාරිය විසින් ස්ථිර දායකත්ව මුදලක් වෙනත් ආයතනයක තැන්පත් කිරීම නිශ්චිත දායකත්ව සැලසුමට අයත්වේ. අධිකාරිය තවදුරටත් දායකත්ව ගෙවීම සඳහා නීතිමය හෝ වෙනත් සම්බන්ධිත බැඳීම් කිසිවක් නොමැත. දායක මුදල් ගෙවිය යුතු විට ඒවා සේවක ප්‍රතිලාභ වියදම් ලෙස පිළිගැනේ.

සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයන්ගේ දළ සේවා පාරිශ්‍රමිකයන් මත 15% දායක මුදලක්ද, සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා දළ සේවා පාරිශ්‍රමිකයන් මත 3% ක දායක මුදලක්ද අධිකාරිය විසින් දරනු ලැබේ.

### (ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම සම්බන්ධව අධිකාරියෙහි බැඳීම වන්නේ වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේදී නිශ්චිත ප්‍රතිලාභ වල පවතින වර්තමාන වටිනාකමයි. පාරිතෝෂිත සූත්‍රය භාවිතයෙන් ගණනය කරන ලද ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් නිශ්චිත ප්‍රතිලාභ වගකීම වාර්ෂිකව මනිනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම තීරණය වන්නේ වත්මන් සහ පෙර කාල සීමාව තුළ සේවකයා තම සේවා සඳහා ප්‍රතිලාභ වශයෙන් උපයා ඇති ඇස්තමේන්තුගත අනාගත ප්‍රතිලාභය වට්ටම් කිරීමෙනි.

උපකල්පනවල වෙනස්වීම් නිසා ඇතිවන ලාභ සහ අලාභ, වත්මන් සේවා පිරිවැය සහ පොලී ඒවා පැනනගින කාල සීමාව තුළ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම බාහිරව අරමුදල් සපයන්නේ නැත.

### (ඇ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

සේවකයන් විසින් සපයන ලද සේවා පදනම් කරගෙන ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂා කරනු ලබන වට්ටම් නොකරන ලද මුදල මත කෙටිකාලීන සේවක ප්‍රතිලාභ බැඳීම ගණනය කරනු ලැබේ.

## 1.12 වෙන්කිරීම් සහ අසම්භාව්‍ය වගකීම්

නිශ්චිත වශයෙන් ගණනය කළ හැකි හා ආර්ථික සම්පත් ඉවතට ගලායාමේ සම්භාවිතාවක් ඇති බව පසුගිය සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස නීතිමය අයුරින් හෝ වටහා ගතහැකි පරිදී වර්තමාන බැඳීම් අධිකාරියට ඇතිවිට නීතිමය ඉල්ලීම් මත වෙන්කිරීම් හා අනෙකුත් ක්‍රියාකාරි වියදම් හඳුනා ගැනේ.

වාර්තාකරනු ලබන දිනය වන විට පිළිගත හැකි සාක්ෂි තිබේනම් හා වර්තමාන බැඳීම් සමග අවදානම සහ අවිනිශ්චිතාව සම්බන්ධ වී ඇතුළත්ව තිබේ නම්, වර්තමාන බැඳීම් පියවීම සඳහා අවශ්‍යවන ඇස්තමේන්තුගත වියදම් අනුව වෙන්කිරීම් ගණනය කරනු ලැබේ.

සම්පත් ඉවතට යාමේ සම්භාවිතාවයක් නොමැති නම් සියලු අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් මගින් හෙළිදරව් කර ඇත.

**1.13 අදායම් හඳුනාගැනීම**

ලැබූ හා ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ (consideration) සාධාරණ අගය සැලකිල්ලට ගෙන ආදායම් ගණනය කරන අතර මැණික් ගැරීමේ අයිතිය අලෙවි කිරීම, බලපත්‍ර ගාස්තු, නිර්යාත කොමිස් හා සේවා සැපයීම්, එකතු කල අගය මත බදු (VAT) හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) වෙනුවෙන් ලැබිය යුතු ආදායම නියෝජනය කරයි. ආදායම් ප්‍රමාණය නිශ්චිත ලෙස ගණනය කළ මැනිය හැකි විට සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ අධිකාරියට ගලා ඒමට ඉඩ ඇති විට අධිකාරිය ආදායම් හඳුනා ගනී.

අධිකාරිය විසින් සපයනු ලබන එක් එක් හඳුනාගත හැකි ප්‍රධාන සේවා වර්ගය සඳහා පහත දක්වා ඇති ආදායම් හඳුනාගැනීමේ නිර්ණායක යොදා ගැනේ.

**(අ) මැණික් ගැරීමේ අයිතිය අලෙවිය (ඉඩම් වෙන්දේසි)**

මැණික් ගැරීමේ අයිතිය යනු බලපත්‍රලාභියාට වෙන් කර ඇති ඉඩම් වල මැණික් ගැරීමේ බලපත්‍ර ලබා දීම සඳහා අය කරන ලද මිල ගණන් වේ. මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදී අදායම් හඳුනා ගැනේ.

**(ආ) බලපත්‍ර ගාස්තු - මැණික් කැපීමේ, ඔප දැමීමේ බලපත්‍ර**

බලපත්‍රයේ කාල සීමාව අනුව සෘජු ක්‍රමය යටතේ බලපත්‍ර ගාස්තු ආදායම් හඳුනා ගැනේ.

**(ඇ) බලපත්‍ර ගාස්තු - මැණික් ගැරීමේ, යන්ත්‍ර මගින් මැණික් ගැරීමේ (BACO) සහ මැණික් වෙන්දේසි බලපත්‍ර**

මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කරන අවස්ථාවේදි බලපත්‍ර ගාස්තු ආදායම් හඳුනා ගැනේ.

**(ඈ) මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත කොමිස් - (අපනයන සේවා ගාස්තු සහ කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු)**

භාණ්ඩ අපනයන කිරීමට සූදානම් කළ අවස්ථාවේදී අපනයන කොමිස් ආදායම් ලෙස හඳුනා ගැනේ.

**(ඉ) සේවා**

මැණික් ඉඩම් පරීක්ෂා කිරීම වෙනුවෙන් වූ ආදායම් ගෙවීම් ලැබෙන අවස්ථාවේදී ආදායම් ලෙස හඳුනා ගැනේ.

**(ඊ) කුලී ආදායම්**

බදු කොන්දේසි සැලකිල්ලට ගෙන උපචිත පදනම මත කුලී ආදායම හඳුනා ගැනේ.

(උ) **පොලී ආදායම්**

ක්‍රියාත්මක වන පිරිවැය ක්‍රමය මත පොලී ආදායම් හඳුනා ගැනේ.

(ඌ) **ලාභාංශ ආදායම්**

ගෙවීම් කිරීම තහවුරු කරනු ලබන අවස්ථාවේදී ලාභාංශ ආදායම් හඳුනා ගැනේ.

(එ) **දේපළ, පිරියත හා උපකරණ ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු**

ඉවත් කිරීමේදී ඇතිවන ලාභ හෝ පාඩු තීරණය කිරීම එම වත්කමෙහි දරනු ලබන අගය සහ විකුණා ලැබෙන මුදල සමග සැසඳීමෙන් පසුව විස්තීරණ ආදායම් ප්‍රකාශයන් හීදී සිදුකෙරේ.

## 1.14 වියදම්

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයට අදාළව ලාභ ඉපයීම සඳහා ආයතනයේ මෙහෙයුම් පවත්වාගෙන යාමට දරනු ලබන සියලු වියදම් ඇතුළත්වේ.

## 1.15 වාර්තා කරනු ලබන කාලයට පසු සිදුවීම්

වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයට පසු සිදුවීම් වල භෞතිකව සලකා බලා ඇති අතර මූල්‍ය ප්‍රකාශනයන් හී අදාළ සටහන්වල සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

## 1.16 බැඳීම්

වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ පවතින සියලු ප්‍රමාණාත්මක බැඳීම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර ඇත.

## 1.17 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණයන්

මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හඳුනා ගැනීමට සහ ඒවා ගණනය කිරීමට කළමණාකාරිත්වය විසින් බොහෝ තීරණයන් ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදුකර ඇත.

i. ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවලට වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇති කරන වැදගත් විනිශ්චයන් පහත සඳහන් වේ.

(අ) **විලම්භිත බදු වත්කම් හඳුනාගැනීම**

විලම්බිත බදු වත්කම් හඳුනා ගත හැකි ප්‍රමාණය පදනම් වන්නේ විලම්භිත බදු වත්කම් භාවිතා කළ හැකි අනාගත බදු අය කළ හැකි ආදායමේ සම්භාවිතාව තක්සේරු කිරීම මත ය.

ii. වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් හඳුනාගැනීම සහ ගණනය කිරීම් වලදී බොහෝ වැදගත් ඇස්තමේන්තු සහ උපකල්පනයන් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

(අ) **ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය**

වත්කමෙහි අපේක්ෂිත ආර්ථික භාවිතය මත පදනම්ව වාර්තා කරනු ලබන දිනට ක්ෂය වන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාල ඇස්තමේන්තුව

කළමනාකාරිත්වය සලකා බලනු ලැබේ. මෙම ඇස්තමේන්තු වල තාක්ෂණික කල් ඉකුත්වීමට සම්බන්ධ අවිනිශ්චිතතාවයන් ඇතැම් මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ උපකරණවල භාවිතය අනුව වෙනස් විය හැකිය.

(ආ) **නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

උපකල්පන ගණනාවක් භාවිතා කිරීමෙන් අපේක්ෂිත ඒකක ණය පදනම මත තීරණය කරනු ලබන සාධක ගණනාවක් මත අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම් වගකීම්වල වර්තමාන වටිනාකම රඳා පවතී. වට්ටම් අනුපාතය ඇතුළුව නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා වන ශුද්ධ පිරිවැය සහ වගකීම් නිර්ණය කිරීමේදී භාවිතා කරන උපකල්පන අනාවරණය කර ඇත. නිශ්චිත ප්‍රතිලාභ බැදීම් වල වර්තන වටිනාකමට මෙම උපකල්පනයන්ගේ වෙනස්වීම් බලපානු ලැබේ.

# ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

2

| | දායක ප්‍රාග්ධනය | මැණික් ගැරීමේ සුභසාධක අරමුදල | ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල | මැණික් ත්‍යාග අරමුදල | අනිකුත් සංචිත | මැණික් ප්‍රත්‍යාගණන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපයුම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **2020 ජනවාරි 01 දිනට ශේෂය** | 30,000,000 | 30,367,824 | 76,067,905 | 46,394,098 | - | 355,074,648 | 52,945,425 | 981,889,161 | 1,572,739,061 |
| සාධාරණ අගයට ගැලපීම් | - | - | - | - | - | - | - | - | - |
| වර්ෂය සඳහා ලාභය | | | | | | | | 4,198,591 | 4,198,591 |
| අනෙකුත් විස්තීරණ ආදායම් | - | - | - | - | - | - | - | - | - |
| **විස්තීරණ ආදායම් එකතුව** | | | | | | | | | **1,576,937,652** |
| පසුගිය වර්ෂයට ගැලපීම් | | | | | | | | | |
| වර්ෂය සඳහා දායකත්වය/ (උපයෝජනය) | | | | | | | | | |
| අගය අඩුවීමට ගැලපීම් | | 1,372,050 | | (1,646,540) | | | | (182,613) | (457,103) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **30,000,000** | **31,739,874** | **76,067,905** | **44,747,558** | **-** | **355,074,648** | **52,945,425** | **985,905,139** | **1,576,480,549** |
| සාධාරණ අගයට ගැලපීම් | | | | | | | | | |
| වර්ෂය සඳහා ලාභය | | | | | | | | 164,372,389 | 164,372,389 |
| අනෙකුත් විස්තීරණ ආදායම් | | | | | | | | | |
| **විස්තීරණ ආදායම් එකතුව** | | | | | | | | | |
| පෙර වර්ෂය සඳහා ගැලපීම්(සටහන 39) | | | | | | | | | |
| වර්ෂය තුළ දායකත්වය/ (උපයෝජනය) | | | | | | | | | |
| හානි පාඩු සඳහා ගැලපීම් | - | 2,415,000 | 6,468,913 | 1,847,248 | - | - | - | - | 10,731,161 |
| **2021දෙසැම්බර් 31 දිනට ශේෂය** | **30,000,000** | **34,154,874** | **82,536,818** | **46,594,806** | **-** | **355,074,648** | **52,945,425** | **1,150,277,528** | **1,751,584,099** |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
### 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

| 3 දේපල, පිරියත හා උපකරණ පිරිවැය | 2021 ජනවාරි 01 දිනට | එකතු කිරීම් | (ඉවත් කිරීම්) | 2021 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| බැඳීම් වලින් නිදහස් | | | | |
| ඉඩම් | 40,374,059 | - | - | 40,374,059 |
| ගොඩනැගිලි | 380,299,194 | 7,979,039.41 | - | 388,278,233 |
| සවිකිරීම් සහ උපකරණ | 22,018,897 | 1,560,225.00 | - | 23,579,122 |
| ලීබඩු | 17,920,099.94 | 4,116,455.84 | - | 22,036,556 |
| කාර්යාල උපකරණ | 24,975,375 | 40,200.00 | - | 25,015,575 |
| පරිගණක | 31,608,556 | 10,261,298.89 | - | 41,869,855 |
| රසායනාගාර උපකරණ | 58,714,965 | 1,435,082.00 | - | 60,150,047 |
| මැණික් කැපීමේඋපකරණ | 403,475 | - | - | 403,475 |
| ස්වර්ණාභරණ උපකරණ | 148,200 | - | - | 148,200 |
| තත්ත්ව මුද්‍රා උපකරණ | 135,946,647 | 37,237,038.51 | - | 173,183,686 |
| යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ | 11,934,841 | 1,855,500.90 | - | 13,790,342 |
| රථ වාහන | 118,672,998 | - | - | 118,672,998 |
| යතුරු පැදි | 100,000 | - | - | 100,000 |
| පාපැදි | 37,334 | - | - | 37,334 |
| පුස්තකාල පොත් | - | | - | - |
| ඉඩකඩ වෙන්කිරීම් | 9,238,579 | 382,114.70 | - | 9,620,694 |
| ඉඩකඩ වෙන්කිරීම් - ජංගම පරීක්ෂණාගාර | 2,456,500 | - | - | 2,456,500 |
| කල් බදු | | | | |
| ඉඩම් | 159,205 | - | - | 159,205 |
| | **855,008,924** | **64,866,955** | - | **919,875,880** |

| ක්ෂයවීම් | **2021 ජනවාරි 01 දිනට** | වසර සඳහා අය කිරීම | **(ඉවත් කිරීම්)** | **2021 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|---|---|
| **බැදීම් වලින් නිදහස් ක්ෂයවීම්** | | | | |
| ගොඩනැගිලි | 54,617,042.41 | 7,741,518 | | 62,358,561 |
| සවිකිරීම් සහ උපකරණ | 16,053,548.25 | 1,099,112 | | 17,152,660 |
| ලීබඩු | 13,086,260.29 | 651,449 | | 13,737,710 |
| කාර්යාල උපකරණ | 18,037,642.19 | 1,513,611 | | 19,551,254 |
| පරිගණක | 28,831,939.14 | 2,234,134 | | 31,066,073 |
| රසායනාගාර උපකරණ | 25,129,702.46 | 4,910,569 | | 30,040,271 |
| මැණික් කැපිමේ උපකරණ | 403,475.00 | - | | 403,475 |
| ස්වර්ණාභරණ උපකරණ | 148,200.00 | - | | 148,200 |
| තත්ත්ව මුද්‍රා උපකරණ | 74,514,634.69 | 14,484,131 | | 88,998,766 |
| යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ | 9,341,422.41 | 364,248 | | 9,705,671 |
| රථ වාහන | 115,221,117.00 | 1,339,165 | | 116,560,282 |
| යතුරු පැදි | 100,000.00 | - | | 100,000 |
| පාපැදි | 37,334.00 | - | | 37,334 |
| පුස්තකාල පොත් | - | - | | - |
| ඉඩකඩ වෙන්කිරීම් | 9,238,579.00 | 93,523 | | 9,332,102 |
| ඉඩකඩ වෙන්කිරීම් - ජංගම පරීක්ෂණාගාර | 2,456,500.00 | - | | 2,456,500 |
| | **367,217,397** | **34,431,461** | **-** | **401,648,858** |

| ශුද්ධ ධාරන අගය | 2021 දෙසැම්බර් 31 දිනට | 2020 දෙසැම්බර් 31 දිනට | 2020 ජනවාරි 01 දිනට |
|---|---|---|---|
| ඉඩම් | 40,374,059.00 | 40,374,059.00 | 40,374,059 |
| ගොඩනැගිලි | 325,919,672.74 | 325,682,151.59 | 113,404,408 |
| සවිකිරීම් සහ උපකරණ | 6,426,461.89 | 5,965,348.70 | 5,822,039 |
| ලීබඩු | 8,298,846.27 | 4,833,839.65 | 3,438,538 |
| කාර්යාල උපකරණ | 5,464,321.29 | 6,937,732.60 | 7,313,695 |
| පරිගණක | 10,803,781.89 | 2,776,616.95 | 2,050,017 |
| රසායනාගාර උපකරණ | 30,109,775.12 | 33,585,262.14 | 13,745,246 |
| තත්ත්ව මුද්‍රා උපකරණ | 84,184,919.87 | 61,432,012.31 | 73,139,778 |
| යන්ත්‍ර සහ ගෙවුඩ උපකරණ | 4,084,671.19 | 2,593,418.68 | 2,797,257 |
| රථ වාහන | 2,112,715.36 | 3,451,880.85 | 2,416,439 |
| ඉඩකඩ වෙන්කිරීම් | 288,591.94 | - | 69,193 |
| ඉඩකඩ වෙන්කිරීම් -ජංගම පරීක්ෂණාගාර | - | - | 614,125 |
| **කල්බදු** | | | |
| ඉඩම් | 159,205.00 | 159,205.00 | 159,205 |
| | **518,227,021.56** | **487,791,527** | **265,343,999** |
| **හානි සඳහා වෙන්කිරීම්** | (3,907,222.61) | (3,431,368) | (2,934,756) |
| | **514,319,798.95** | **484,360,159** | **262,409,243** |

විගණකවරුන්ගේ නිර්දේශයන් අනුව සමහර මෝටර් වාහන සහ ප්‍රධාන කාර්යාලයේ දේපළ වටිනාකම නැවත තක්සේරු කරන ලදී. වාහන වල (වාහන අංක KC-4060 ,HT-4219 ,PD-9084,KS-8727,HP-9913 හැර) නැවත තක්සේරු කරන ලද වටිනාකම රු.79,920,000.00 ක් විය. ප්‍රධාන කාර්යාලයේ නැවත තක්සේරු කරන ලද දේපළ වටිනාකම රු.340,000,000.00 ක් විය.

බෙලිදෙණිය ඉඩම - මෙම ඉඩමෙන් හෙක්ටයාර 0.1095 ක් වු ප්‍රමානයක් 2017 ජූලි 07 දිනැති අංක 2026/37 විශේෂ ගැසට් පත්‍රය මගින් නැවත ඉඩම් හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙත පවරා ගන්නට යෙදුණි.

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

**4. කල්බදු ඉඩම් - ඉඩම් භාවිතය සඳහා අයිතිය**

**ආරම්භයේ දී දරන ලද වර්ධක ණය ගැනීමේ අනුපාතය භාවිතා කරමින් කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට සමානව මුදලකින් වට්ටම් කර ඉඩම භාවිතා කිරීමට ඇති අයිතිය මනිනු ලබන අතර කල්බදු කාල සීමාව තුළ ක්ෂය කරනු ලබයි.**

| | 2021 | 2020 |
|---|---|---|
| **ඉඩම් භාවිතය සඳහා දරන වටිනාකම** | | |
| **ප්‍රාග්ධනිත අගය** | | |
| ජනවාරි 01 දිනට | **70,909.00** | **70,909** |
| දරන ලද මූලික පිරිවැය | - | - |
| වර්ෂය තුළ ප්‍රාග්ධනිත කිරීම් | - | |
| දෙසැම්බර් 31 දිනට | **70,909.00** | **70,909** |
| **ක්‍රමක්ෂය** | | |
| ජනවාරි 01 දිනට | **56,730.30** | **54,366** |
| වර්ෂය තුළ ක්‍රමක්ෂය වීම | 2,364.00 | 2,364 |
| දෙසැම්බර් 31 දිනට | **59,094.30** | **56,730** |
| දරනු ලබන වටිනාකම **ක්‍රමක්ෂය** | **11,814.70** | **14,179** |

**අවුරුදු 30 දක්වා ඉඩම්වල කල්බදු අයිතිය 1997 නොවැම්බර් මස ආරම්භ විය. කල්බදු කොන්දේසි අනුව 2026 නොවැම්බර් දක්වා වාර්ෂිකව ඉඩම් භාවිතය සඳහා වූ කල්බදු අයිතිය සංක්‍රාන්ති අවධියේ (2011 ජනවාරි 01) සිට ඉදිරි කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.**

| **5. අස්පෘශ්‍ය වත්කම්** | **2021 දෙසැම්බර් 31 දිනට** | **එකතු කිරීම්/ඉවත් කිරීම්** | **2020 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|---|
| **5.1 පිරිවැයට** | | | |
| පරිගණක මෘදුකාංග | 2,677,306.12 | - | 2,677,306 |
| **එකතුව** | **2,677,306.12** | - | **2,677,306** |
| **5.2 ක්‍රමක්ෂය** | | | |
| පරිගණක මෘදුකාංග | 2,677,306.12 | - | 2,677,306 |
| **එකතුව** | **2,677,306.12** | - | **2,677,306** |
| **5.3 ශුද්ධ ධාරණ අගය** | | | |
| පරිගණක මෘදුකාංග | - | - | - |
| **එකතුව** | - | - | - |

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය**
**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්**

| | | | 2021 | 2020 |
|---|---|---|---|---|
| **6** | **විලම්භිත බදු වත්කම්/(වගකීම්)** | | | |
| | ජනවාරි 01 දිනට ශේෂය | | 24,644,383.96 | 32,757,121 |
| | ගැලපීම් | | (276,253.19) | (8,112,737.24) |
| | දෙසැම්බර් 31 දිනට ට ශේෂය | | **24,368,130.77** | **24,644,384** |
| **7** | **අනෙකුත් වත්කම්** | | | |
| | රළු ගල් සහ සින්තටික් ගල් | | 96,682.58 | 96,682.58 |
| | ප්‍රදර්ශන මැණික් ගල් | | 371,842,648.00 | 371,842,648.00 |
| | මැණික් සහ මැණික් ආයතන වලට අත්තිකාරම් ගෙවීම් | | 200,000.00 | 200,000.00 |
| | | | **372,139,330.58** | **372,139,331** |
| | හානි පාඩු සඳහා වෙන්කිරිම් | | (200,000.00) | (200,000.00) |
| | | | **371,939,330.58** | **371,939,331** |
| **8** | **විකිණිය හැකි (AFS) මූල්‍ය වත්කම්** | | | |
| | **ලැයිස්තු ගත නොකළ ආයෝජන** | කොටස් සංඛ්‍යාව | | |
| | සීමාසහිත ලංකා එක්සත් පුවත්පත් සමාගම | 20,000 | 200,000.00 | 200,000.00 |
| | ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා පුද්ගලික සමාගම | 100,000 | 1,000,000.00 | 1,000,000.00 |
| | එල්ජීඑල් පුද්ගලික සමාගම | 1 | 10.00 | 10.00 |
| | | | **1,200,010.00** | **1,200,010** |
| **9** | **භාණ්ඩ තොග** | | | |
| | පාරිභෝගික භාණ්ඩ | | 2,905,391.07 | 922,095.89 |
| | මැණික් - ගෙවුඩ මධ්‍යස්ථානය | | 183,547.54 | 183,547.54 |
| | මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය තොග | | 1,003,636.00 | 1,464,125.71 |
| | | | **4,092,574.61** | **2,569,769** |
| **10** | **ලැබිය යුතු දෑ** | | | |
| | ලැබිය යුතු දෑ | | 85,984,392.83 | 63,016,724.87 |
| | හානි පාඩු සඳහා වෙන්කිරීම | | (1,407,972.00) | (1,407,972.00) |
| | | | **84,576,420.83** | **61,608,753** |
| | කලින් ගෙවීම් | | 11,043,081.27 | 1,880,692.67 |
| | | | **95,619,502.10** | **63,489,446** |
| **11** | **කල් පිරෙන තෙක් වූ ආයෝජන (HTM)** | | **608,722,189.51** | |
| | **ක්‍රමක්ෂය පිරිවැය මත දරන වටිනාකම** | | **589,902,805.32** | |
| | භාණ්ඩාගාර බිල්පත් | | **1,198,624,994.83** | **1,059,635,760.17** |
| **12** | **තැන්පතු සහ අත්තිකාරම්** | | | |
| | පොදු තැන්පත් | | 178,455,221.39 | 164,839,221.39 |
| | අනෙකුත් | | 30,725.00 | 14,525.00 |
| | ආරක්ෂිත තැන්පතු | | 61,500.00 | 61,500.00 |
| | | | **178,547,446.39** | **164,915,246.39** |
| | හානි පාඩු සඳහා වෙන්කිරීම් | | (1,433,947.00) | (1,433,947.00) |
| | | | **177,113,499.39** | **163,481,299** |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

| | | 2021 | 2020 |
|---|---|---|---|
| **13** | **සේවක ණය සහ අත්තිකාරම්** | | |
| | අත්තිකාරම් | 191,315.01 | 90,065.01 |
| | වැටුප් රහිත නිවාඩු | 143,128.73 | 286,345.90 |
| | වාහන ණය | 4,574.34 | 4,574.34 |
| | රෙදිපිළි ණය | 58,000.24 | 15,000.24 |
| | ආපදා ණය | 14,679,985.05 | 17,546,894.34 |
| | | **15,077,003.37** | **17,942,879.83** |
| **14** | **අනෙකුත් මූල්‍ය වත්කම්** | | |
| | ලංකා බැංකුව | 472,290,195.05 | 449,105,637.41 |
| | මහජන බැංකුව | 327,820,813.21 | 310,424,150.91 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | - | 100,000.00 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 80,708,325.67 | 76,427,672.42 |
| | | **880,819,333.93** | **836,057,460.74** |
| **15** | **මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| | මුදල් හුවමාරු ශේෂයන් | 1,344,082.40 | 1,367,226.80 |
| | මුදල් හා බැංකු ශේෂයන් - ශ්‍රී. ලං. රු | 71,948,422.14 | 44,768,629.32 |
| | බැංකු ශේෂය (විදේශ ව්‍යවහාර මුදල්) | 11,615,905.50 | 7,973,651.84 |
| | | **84,908,410.04** | **54,109,508** |

16. **දායක ප්‍රාග්ධනය**
ශ්‍රී ලංකා මැණික් සංස්ථාව විසින් අධිකාරිය ආරම්භයේදී පවරා දෙනු ලැබූ අගයයන් සහ අධිකාරියට යොමු කළ ප්‍රාග්ධනය මගින් ආරම්භක ප්‍රාග්ධනය නියෝජනයවේ.

17. **මැණික් ගැරීමේ සුභසාධක අරමුදල**
මැණික් කර්මාන්තයේ නියුතු සේවකයන්ගේ ජීවිත අවදානම නිසා ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අධිකාරිය විසින් 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 1 කොටසේ 14(එන්) වගන්තියට අනුකූලව 2008 දක්වා සහ නැවත 2015 සිට මැණික් ගරන්නන්ගෙන් අරමුදල් එකතු කරන ලදී.

18. **ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල**
ස්වර්ණාභරණ කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනය වෙනුවෙන් 2007 අයවැය යෝජනා අනුව ස්වර්ණාභරණ නිෂ්පාදකයින් ගෙන් ලද වාර්ෂික ලියාපදිංචි ගාස්තුව වූ රු.5,000 බැගින් වූ මුදලින් මෙම අරමුදල සංයුක්ත වේ.

19. **මැණික් ත්‍යාග අරමුදල**
1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ iv කොටසේ 52 වගන්තියේ අවශ්‍යතාවය අනුව අධිකාරිය වෙත ලැබෙන අපරාධ වෙනුවෙන් අදාල පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු සහ දඩ මුදල් දඩ අරමුදල වෙත බැර කිරීමෙන් මෙම අරමුදල සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල චක්‍රලේක අංක 824 උපදෙස් අනුව වැටලීම් කණ්ඩායම්වලට සහ සේවකයන්ට ත්‍යාග පිරිනැමීම සඳහා මෙම අරමුදල නඩත්තු කෙරේ.

20. **මැණික් ප්‍රත්‍යාගණන සංචිත**
මැණික් ප්‍රදර්ශන වලට ඉදිරිපත් කරනු ලබන මැණික් ගල් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇතිවන අතිරික්ත වලින් සමන්විත වේ.

21. **ප්‍රත්‍යාගණන සංචිත**

ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම තුලින් ඇතිවන ප්‍රත්‍යාගණන අතිරික්තයන් ගෙන් ප්‍රත්‍යාගණන සංචිතය සමන්විත වන අතර ප්‍රත්‍යාගණනය කරන ලද එකිනෙක වත්කම් ඉවත් කිරීමේදී එම වත්කමට අදාල ප්‍රත්‍යාගණන අතිරික්ත වටිනාකම රඳවාගත් ඉපයුම් වලට මාරු කරනු ලැබේ.

**22 විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්**

| | 2021 | 2020 |
|---|---|---|
| **ජනවාරි 01 දිනට ශේෂය** | **49,841,554.40** | **35,384,618.26** |
| විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම් හඳුනාගැනීම (සටහන් 22.1) | **960,313.78** | **18,577,488.92** |
| 2021 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම් | (5,048,537.50) | (4,120,552.78) |
| 2021 වර්ෂයේ ගැලපීම් | - | - |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **45,753,330.68** | **49,841,554** |

**22.1 විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි වියදම් හඳුනා ගැනීම**

| | | |
|---|---|---|
| පොලී වියදම | 4,834,630.80 | 2,331,846.36 |
| වර්ෂය තුළ අයකිරීම් | 2,508,880.40 | 2,858,837.83 |
| උපකල්පනයන්ගේ වෙනස්වීම් තුලින් පැන නගින (ලාභ)/ අලාභ ) | (6,383,197.42) | 13,386,804.73 |
| | **960,313.78** | **18,577,488.92** |

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ගණනය කිරීමට භාවිතා කළ අධිකාරියේ කළමනාකාරීත්වයේ වඩාත් උචිත විචල්‍ය ඇස්තමේන්තු පදනම් කරගෙන මෙම උපකල්පනයන් සංවර්ධනය කෙරේ.

**භාවිතා කරනු ලබන මූලික උපකල්පනයන් පහත දැක්වේ.**

| | | |
|---|---|---|
| වට්ටම් අනුපාත (%) | 10 | 7 |
| අනාගත වැටුප් වැඩිවීම් සාමාන්‍ය වේතන (%) | 1.3 | 1.3 |
| සේවක පිරිවැටුම් සාධකය (%) | 2.5 | 0.8 |
| විශ්‍රාම යන වයස (අවුරුදු) | 60 | 60 |

දිගුකාලීන රජයේ බැඳුම්කර වෙළඳ අනුපාත පදනම් කොට ගෙන වට්ටම් අනුපාත තීරණය කරනු ලැබේ

**23 කල්බදු ගෙවීම් සඳහා වූ වගකීම**

| | | |
|---|---|---|
| **දළ වගකීම** | | |
| **ජනවාරි 01 දිනට** | **336,313.00** | **375,801.00** |
| වර්ෂය තුළ හඳුනා ගැනීම් | - | - |
| වර්ෂය තුළ ගෙවීම් | (39,487.00) | (39,488.00) |
| **දෙසැම්බර් 31 දිනට** | **296,826.00** | **336,313** |
| **මූල්‍ය පිරිවැය** | | |
| ජනවාරි 01 දිනට | **331,125.00** | **369,700.00** |
| වර්ෂය තුළ හඳුනා ගැනීම් | - | - |
| වර්ෂය තුළ විස්තීරණ ආදායම තුළ මූල්‍ය පිරිවැය හඳුනා ගැනීම | (38,708.00) | (38,575.00) |
| අනාගත කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | **292,417.00** | **331,125** |
| දෙසැම්බර් 31 දිනට ශුද්ධ බැදීම් | **(4,409.00)** | **(5,188)** |

| 23.1 වගකීම් වර්ගීකරණය | 2021 | 2020 |
|---|---|---|
| **වර්ෂයක් තුළ පියවිය යුතු** | | |
| දළ වගකීම් | 59,900.00 | 40,158.00 |
| අනාගත කාලපරිච්ඡේද සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | (58,232.00) | (38,708.00) |
| | **1,668.00** | **1,450.00** |
| **වර්ෂයක් ඉක්මවීමෙන් පසු පියවිය යුතු** | | |
| **පියවීම වර්ෂ දෙක සහ පහ අතර** | | |
| දළ වගකීම් | 236,925.00 | 236,925.00 |
| අනාගත කාලපරිච්ඡේද සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | (234,183.00) | (233,717.00) |
| | **2,742.00** | **3,208.00** |
| **පියවීම වර්ෂ පහ ඉක්මවූ** | | |
| දළ වගකීම් | - | 59,229.00 |
| අනාගත කාලපරිච්ඡේද සඳහා මූල්‍ය පිරිවැය ප්‍රතිපාදනය | - | (58,699.00) |
| | **-** | **530.00** |
| වර්ෂයක් ඉක්මවා පියවිය යුතු වගකීම් එකතුව | **2,742.00** | **3,738.00** |
| දෙසැම්බර් 31 දිනට ශුද්ධ වගකීම් එකතුව | **4,410.00** | **5,188.00** |

## 24 ගෙවිය යුතු දෑ

| | 2021 | 2020 |
|---|---|---|
| ණයහිමියෝ | 188,791,845.82 | 187,080,463.43 |
| කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවාගත් මුදල් | 13,608,477.56 | 11,888,208.18 |
| ඉඩම් වෙන්දේසි කිරීමෙන් ලැබෙන මුදලින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාවට සහ ඉඩම් හිමියන්ට ගෙවිය යුතු 40% ත් | 11,150,657.67 | 1,190,128.50 |
| | **213,550,981.05** | **200,158,800** |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

| | | 2021 | 2020 |
|---|---|---|---|
| **25** | **තැන්පතු සහ අත්තිකාරම් ලැබීම්** | | |
| | **අත්තිකාරම් ලැබීම්** | | |
| | සේවක ආරක්ෂිත තැන්පතු | 61,500.00 | 61,500.00 |
| | ගණුදෙණුකරුවන්ගේ අත්තිකාරම් | 15,896.26 | 15,896.26 |
| | සේවකයන්ගේ වැඩිපුර අයකර ගැනීම් | 30,088.67 | 8,872.92 |
| | ඉඩම් ආරවුල් තැන්පතු | 101,209,759.14 | 97,046,181.29 |
| | ටෙන්ඩර් තැන්පතු | 9,567,680.00 | 9,197,280.00 |
| | ලෝක වෙළඳ මධ්‍ය. වෙළඳ කුටි රඳවා ගැනීම් | 4,555,138.70 | 25,730,191.70 |
| | මැණික් කෞතුකාගාර අරමුදල | 125,997.00 | 125,997.00 |
| | නිර්යාත කොමිස් තැන්පතු | 280,000.00 | 280,000.00 |
| | | **115,846,059.77** | **132,465,919** |
| **26** | **ව්‍යවස්ථාපිත ගෙවිය යුතු දෑ** | | |
| | සංස්ථාපිත බදු (සටහන් 26.1) | 35,861,818.73 | 14,415,035.75 |
| | එකතුකල අගය මත බදු | 6,184,401.78 | 509,466.50 |
| | රඳවාගත් බදු | - | 19,866.66 |
| | රඳවාගත් මැණික් වෙන්දේසි බදු 2.5% | 347,017,042.23 | 282,966,163.81 |
| | මුද්දර ගාස්තු | 3,447,237.41 | 2,002,919.12 |
| | උපයනවිට ගෙවීමේ බදු | - | 44,887.35 |
| | | **392,510,500.15** | **299,958,339** |

26.1 **සංස්ථාපිත බදු**

| | 2021 | 2020 |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 14,415,036.00 | 3,767,282.78 |
| වර්ෂය සඳහා වර්තන බදු | 37,973,065.73 | 16,680,108.37 |
| වර්ෂය තුළ ගෙවීම් - පසුගිය වසර බැදීම් පියවීම | (10,480,089.00) | - |
| ස්ව තක්සේරු ගෙවීම් | (6,000,000.00) | (6,000,000.00) |
| පසුගිය වර්ෂය සඳහා වූ අධි/(ඌණ) වෙන්කිරීම් මත ගැලපීම | (46,194.00) | (32,355.40) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **35,861,818.73** | **14,415,036** |

| | | 2021 | 2020 |
|---|---|---|---|
| **27** | **වෙන්කිරීම් සහ උපචිත වියදම්** | | |
| | උපචිත වියදම් | 78,328,415.66 | 72,543,993.90 |
| | | 78,328,415.66 | 72,543,993.90 |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

**28 ආදායම්**

| | 2021 | 2020 |
|---|---|---|
| ඉඩම් වෙන්දේසි - රජයේ ඉඩම් | 2,639,395.43 | 881,265.00 |
| ඉඩම් වෙන්දේසි - ඉඩම් ප්‍ර.කොමි. | 560,000.00 | 3,380,000.00 |
| සේවා සහ බලපත්‍ර අභියාචන ගාස්තු | 642,980.00 | 775,100.00 |
| මැණික් ගැරීමේ බලපත්‍ර ගාස්තු | 36,208,018.00 | 30,315,900.00 |
| වෙළඳාම් බලපත්‍ර ගාස්තු | 42,848,080.60 | 39,952,148.00 |
| ත්‍යාග සහ සාම්පල් සඳහා සේවා ගාස්තු | 360,000.00 | 381,000.00 |
| මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත සේවා ගාස්තු | 141,895,336.04 | 83,380,248.94 |
| මැණික් කැපීමේ බලපත්‍ර ගාස්තු | 411,346.00 | 314,840.00 |
| ගෙවුඩ නිර්යාත සේවා ගාස්තු | 6,315,111.32 | 4,274,178.26 |
| LDO ඉඩම් සහ ඛණිජ බද්ද | 4,436,750.00 | 3,816,000.00 |
| දඩ මගින් ආදායම් | 10,648,707.66 | 10,242,459.55 |
| මැණික් වෙන්දේසි බලපත්‍ර | 946,000.00 | 878,000.00 |
| මැණික් පරීක්ෂා කිරීමේ ගාස්තු | 4,790,918.00 | 5,305,829.64 |
| තත්ත්ව මුද්‍රා කාර්යාලයේ ආදායම් | 7,525,480.37 | 10,606,562.00 |
| බලපත්‍ර පිටපත් ගාස්තු | 43,290.32 | 97,238.32 |
| කටුනායක දියමන්ති මධ්‍යස්ථානයේ සේවා ගාස්තු | 8,448,400.00 | 3,563,904.75 |
| මැණික් පාර්සල් නිශ්කාශණයෙන් ආදායම් | 2,583,103.81 | 1,128,500.00 |
| පාරිසරික ආරක්ෂණය | - | 87,600.00 |
| BACO සේවා ගාස්තු | 39,345,000.00 | 23,643,600.00 |
| පරීක්ෂණ ගාස්තු | 40,511,800.00 | 39,919,600.00 |
| ත්‍රීමාන කාඩ් සහ වර්ණ | 3,091,800.00 | 2,854,080.00 |
| මැණික් වෙළඳාම | 19,126,585.14 | 10,478,439.05 |
| සමථ ගාස්තු | 8,980,350.00 | 7,538,000.00 |
| බොරළු ප්‍රවාහන බලපත්‍ර ගාස්තු | 607,340.00 | 1,156,200.00 |
| මැණික් ප්‍රවාහන ගාස්තු ආදායම | 498,168.77 | - |
| ඉංජිනේරුවන් සඳහා පරීක්ෂණ ගාස්තු | 15,963,200.00 | - |
| ව්‍යාපෘති ආදායම | 125,475,200.00 | - |
| වීසා ගාස්තු ආදායම | 985,466.50 | - |
| | **525,887,827.96** | **284,970,694** |

**29 අනිකුත් ආදායම්**

| | 2021 | 2020 |
|---|---|---|
| විවිධ ආදායම් | 583,765.32 | 1,384,751.78 |
| ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ සහ රත්නපුර වෙළඳසැල් | 13,343,831.25 | 20,656,839.62 |
| පොත් අලෙවිය | 22,200.00 | 16,400.00 |
| ලාභාංශ | - | 500,000.00 |
| කුලී ආදායම් | 3,779,423.94 | 2,622,180.31 |
| වෙන්දේසි අයිතම වලින් ලද මුදල් | 2,576,208.00 | 511,310.00 |
| ස්ථාවර වත්කම් අලෙවියෙන් ලද ලාභ | - | - |
| රක්ෂණ නියෝජිතායතන වලින් ලද ආදායම් | 713,719.68 | 345,737.05 |
| ස්වර්ණාභරණ අලෙවිය | - | 359,458.11 |
| ප්‍රදර්ශන වියදම්- විදේශීය/දේශීය (අයකරගැනීම) | 700,000.00 | - |
| | **21,719,148.19** | **26,396,677** |

## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්

| | | 2021 | 2020 |
|---|---|---|---|
| 30 | **පරිපාලන වියදම්** | | |
| | දායක මුදල් | 1,278,565.91 | 876,826.77 |
| | සංග්‍රහ වියදම් - (දේශීය) | 1,732,568.51 | 1,123,143.71 |
| | දුරකථන ගාස්තු | 4,074,472.91 | 4,228,371.65 |
| | තැපැල් හා මුද්දර | 931,945.16 | 841,241.00 |
| | අන්තර්ජාල ගාස්තු | 4,511,366.45 | 2,228,454.07 |
| | අධ්‍යක්ෂ මණ්ඩල වියදම් | 1,123,112.65 | 1,069,000.00 |
| | කුලී | 23,374,414.31 | 4,673,086.23 |
| | විදුලිය | 7,867,468.21 | 8,872,473.58 |
| | වරිපනම් සහ බදු | 1,128,590.75 | 1,376,854.71 |
| | පුවත් පත් සහ වාර සඟරා | 38,350.00 | 166,960.00 |
| | ජල ගාස්තු සහ බදු | 959,417.92 | 1,305,395.41 |
| | ප්‍රවාරක | 954,820.00 | 326,070.00 |
| | ප්‍රවාහන | 1,126,836.33 | 303,484.26 |
| | රක්ෂණය | 1,420,772.04 | 1,238,714.77 |
| | නීති වියදම් | 2,683,906.50 | 2,234,055.00 |
| | වර්ෂය සඳහා විගණන ගාස්තු | 1,049,260.00 | 1,200,000.00 |
| | මිනින්දෝරු ගාස්තු | - | 669.60 |
| | කළමනාකාරිත්ව උපදේශක ගාස්තු | 40,025.00 | 77,975.00 |
| | ගොඩනැගිලි නඩත්තු | 12,549,804.12 | 8,042,174.88 |
| | උපකරණ නඩත්තු | 2,613,873.69 | 3,429,788.05 |
| | ආරක්ෂක සේවා | 19,862,720.00 | 14,930,070.00 |
| | වැඩමුළු සහ පුහුණු (දේශීය) | 88,924.84 | 457,699.86 |
| | වැඩමුළු සහ පුහුණු (විදේශීය) | 320,000.00 | 583,486.15 |
| | වැටලීම් වියදම් | 223,610.00 | 409,480.00 |
| | සාමාන්‍ය වෙන්දේසි වියදම් | 693,212.08 | 548,659.00 |
| | පරිත්‍යාග | 200,000.00 | 192,475.00 |
| | පාරිභෝගික වත්කම් | 24,567.00 | 124,953.89 |
| | කාර්යාල මිලදී ගැනීම් | 4,309,442.61 | 1,937,623.09 |
| | භාවිත ඉඩම් අයිතියේ ක්‍රමක්ෂය | 2,364.00 | 2,364.00 |
| | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 2,957,334.71 | 2,071,457.31 |
| | පරීක්ෂණාගාර සැපයුම් | 174,837.20 | 453,628.00 |
| | පාරිසරික වියදම් | 84,890.00 | 321,471.00 |
| | ක්ෂවීම් | 34,431,460.46 | 27,218,458.56 |
| | අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය | - | - |
| | ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කුලී | 12,953,040.00 | 24,212,082.00 |
| | ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ විදුලිය බිල | 559,240.08 | 926,472.00 |
| | රථ වාහන නඩත්තු | 8,675,598.85 | 8,506,178.91 |
| | ඉන්ධන සහ තෙල් | 8,835,003.24 | 5,823,409.50 |
| | ටයර් සහ ටියුබ් | 1,339,256.56 | 1,186,583.32 |
| | රථ වාහන රක්ෂණ සහ බලපත්‍ර | 439,823.62 | 1,136,089.07 |
| | රථ වාහන නැවතුම් ගාස්තු | - | 20.00 |
| | පොදු වියදම් | 427,634.73 | 842,785.22 |
| | ව්‍යාපෘති වියදම් | 7,339,125.64 | 481,109.60 |
| | බැංකු ගාස්තු | 828,776.34 | 563,096.42 |
| | මැණික් ගරන්නන් සඳහා වූ ශිෂ්‍යත්ව වියදම් | 1,648,500.00 | 1,500,000.00 |
| | මැණික් ඉඩම් පුනරුත්ථාපනය | 3,099,934.00 | 2,109,670.00 |
| | හාණි පාඩු ප්‍රතිපාදන - වත්කම් | 475,854.03 | 496,612.58 |
| | | **179,454,720.45** | **140,650,673.17** |

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය**
**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයට සටහන්**

| | | 2021 | 2020 |
|---|---|---|---|
| **31** | **සේවක වියදම්** | | |
| | වේතන සහ දීමනා | 136,810,653.41 | 139,432,421.65 |
| | වැඩ බැලීමේ දීමනා/අවධානම් දීමනා | 429,433.00 | 333,780.60 |
| | සේවක අර්ථ සාධක යටතට නොගැනෙන වේතන | 5,237,666.36 | 7,686,773.26 |
| | සේවක අර්ථ සාධක අරමුදල | 22,327,024.31 | 23,122,831.20 |
| | සේවක භාරකාර අරමුදල | 4,465,404.98 | 4,504,566.56 |
| | අතිකාල | 6,639,611.17 | 5,375,233.32 |
| | නිවාඩු දින වැඩකිරීම සඳහා ගෙවීම | 48,009.50 | - |
| | ත්‍යාග (රන් පදක්කම්) | - | 84,500.00 |
| | නිවාඩු ප්‍රසාද දීමනා | 12,480,231.75 | 14,197,065.36 |
| | සේවක නිවාස ණය පොලී ගෙවීම් | 185,459.80 | 171,398.32 |
| | සේවක දිරි දීමනා | 12,276,354.00 | 3,500,753.56 |
| | පාරිතෝෂික | 960,313.78 | 18,577,488.92 |
| | ගමන් වියදම් (දේශීය) | 1,468,483.00 | 1,746,542.77 |
| | කාර්ය මණ්ඩල නිල ඇඳුම් | 443,450.00 | 283,970.04 |
| | සේවක සුභ සාධන | 11,071,484.64 | 8,094,918.68 |
| | වෛද්‍ය ගාස්තු | 13,887,746.23 | 10,475,280.91 |
| | ප්‍රවාහන දීමනා | 13,455,000.00 | 13,695,000.00 |
| | | **242,186,325.93** | **251,282,525** |
| **32** | **ප්‍රවර්ධන වියදම්** | | |
| | ගමන් වියදම් ( විදේශීය) | 476,710.00 | - |
| | ප්‍රදර්ශන වියදම් ( දේශීය) | - | 276,417.83 |
| | ප්‍රදර්ශන වියදම් ( විදේශීය) | 7,746,906.76 | - |
| | ප්‍රචාරණය ( දේශීය) | 1,400,110.00 | 347,705.00 |
| | ප්‍රවර්ධන වියදම් | 3,279,901.53 | 1,194,399.09 |
| | | **12,903,628.29** | **1,818,522** |
| **33** | **ශුද්ධ මූල්‍ය ආදායම්** | | |
| | **පොලී ආදායම්** | | |
| | ස්ථාවර තැන්පත් සහ භාණ්ඩාගාර බිල්පත් මත පොලී | 128,458,355.97 | 116,057,698.59 |
| | සේවක ණය පොලී | 541,058.42 | 477,852.09 |
| | | **128,999,414.39** | **116,535,551** |
| | **පොලී වියදම්** | | |
| | කල් බදු ගෙවීම් බැරකම් මත වූ මූල්‍ය පිරිවැය | (38,708.00) | (38,575.00) |
| | | **(38,708.00)** | **(38,575.00)** |
| | | **128,960,706.39** | **116,496,976** |

| | | 2021 | 2020 |
|---|---|---|---|
| **34** | **ආදායම් බදු වියදම්** | | |
| | වර්තමාන බදු වියදම් **(සටහන් 34.1)** | 37,973,065.73 | 16,680,108.37 |
| | පසුගිය වසර සඳහා (ඌණ)/ අධි වෙන්කිරීම් මත ගැලපීම් | (46,194.00) | (32,355.40) |
| | විලම්භිත බදු ගාස්තු/ (වෙනස් කිරීම්) (සටහන් 6) | (276,253.00) | (8,112,737.24) |
| | | **37,650,618.73** | **8,535,016** |
| | **34.1 වර්තන බදු වියදම් සහ නිෂ්පාදන ගිණුම්කරණ ලාභය සැසඳීම** | | |
| | **ඒකාබද්ධ අරමුදලට දායක ගෙවීමෙන් පසු බදු වීමට පෙර ලාභය** | **202,023,008** | **12,733,606** |
| | ඉඩ නොදෙන අයිතමයන් එකතුව | 81,847,206.00 | 71,601,241.00 |
| | ඉඩ දිය හැකි අයිතමයන් එකතුව | (50,978,748.00) | (33,647,514.00) |
| | අනිකුත් ප්‍රභවයන්ගෙන් ආදායම් | (146,122,670.00) | (140,314,571.00) |
| | **වෙළඳ හෝ ව්‍යාපාරික කටයුතු වලින් ලාභ/(පාඩු)** | **86,768,796** | **(89,627,238)** |
| | බදු සඳහා අදාල අනිකුත් ආදායම් - පොලී ආදායම් | 146,122,669.60 | 139,814,570.60 |
| | **එකතු ව්‍යවස්ථාපිත ආදායම්** | **232,891,465.47** | **139,814,571** |
| | සුදුසුකම් ලබන ගෙවීම් | (40,000,000.00) | (21,379,019.36) |
| | බදු පාඩු උපයෝජනය | (34,670,358.27) | (48,935,099.71) |
| | **තක්සේරුගත ආදායම් /බදු අයකල හැකි ආදායම්** | **158,221,107** | **69,500,452** |
| | 24%ව්‍යවස්ථාපිත බදු අනුපාතය මත බදු ගාස්තු | 37,973,066 | 16,680,108 |
| | බෙදිය හැකි ලාභ මත බදු | - | - |
| | වර්ෂය සඳහා සාමන්‍ය කටයුතු මත වර්තන බදු | **37,973,066** | **16,680,108** |

**35. ප්‍රාග්ධන සහ අනිකුත් බැදීම්**

ක්‍රියාත්මක වෙමින් පවතින දෙමුවාවත ගොඩනැඟිල්ල, රත්නපුර ගොඩනැඟිල්ල ඉදිකිරීම් සම්බන්ධ අතුරු ගෙවීම් කර තිබුණි. මිලියන 10.45 ක පරිගණක මෘදුකාංග පැකේජය සංවර්ධන කාර්යයෙන් 60% ක් නිම කර ඇති බව සහතික කර ඇත.

**36. වාර්තාකරණ කාල පරිච්ඡේදයට පසු ඇතිවන සිදුවීම්**

ශේෂපත්‍ර දිනෙන් පසුව ප්‍රදර්ශන මැණික් ප්‍රත්‍යාගණනය කරන ලද අතර ගල්වල ප්‍රත්‍යාගණන අගය රු. 765,316,000.00ක් වේ

**37. අසම්භාව්‍ය බැරකම්**

අධිකාරියෙහි සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු හේතුවෙන් පැන නගිනු ලබන නිත්‍යානුකූල අසම්භාව්‍ය බැරකම් ඇත. වෙන්කිරීම් ලෙස හඳුනා නොගන්නේ නම් (සටහන 27), කළමනාකාරිත්වය මෙම හිමිකම් සාධාරණීකරනය කළ නොහැකි ලෙස සලකන අතර ඒවා පියවීම සඳහා සම්පත් පිටතට ගලා යාමේ හැකියාව දුරස්ථ වේ. අධිකාරියෙහි නීති අංශයේ නීති උපදෙස් මත මෙම ගණනය කිරීම් රඳා පවතිනු ඇත.

**38. සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම**

අධිකාරියෙහි අදාල පාර්ශවයන් මහා භාණ්ඩාගාරය, රජයට සම්බන්ධිත ආයතන, රාජ්‍ය ව්‍යවසාය ආයතන සහ ප්‍රධාන කළමණාකරණ පුද්ගලයින් ගෙන් සමන්විත වේ.

මැණික් හා ස්වර්ණාභරණ නිර්යාත මගින් එකතු කර ගන්නා ලද අරමුදලින් ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය සමඟ ලංකා ජෙමලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සාමාගම (Lanka Gemalogicla Laboratory (pvt) Ltd) පිහිටුවා ඇති අතර 2014 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය රු. 126,512,567.00 ක් විය

38.1 **ප්‍රධාන කළමණාකාරීත්ව පුද්ගලයන් සමඟ සිදුවු ගණු දෙණු**

ශ්‍රී ලංකා ගිණුම්කරණප්‍රමිත 24 "සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම" අනුව ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන්හට කෙලින්ම හෝ වක්‍රව ආයතනයේ කටයුතු කෙලින්ම හෝ වක්‍රව සැලසුම් කිරීම, මගපෙන්වීම්, පාලනය කිරීම් පිළිබද වගකීම පැවරී ඇත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් ලෙස වර්ගීකරණය කෙරේ.

| ප්‍රධාන කළමණාකාරීත්වයේ පුද්ගලයන් සමග සිදුවු ගණුදෙණු පහත දක්වා ඇත. | 2021 | 2020 |
|---|---|---|
| පාරිශ්‍රමික සහ අනෙකුත් කෙටි කාලීන සේවක ප්‍රතිලාභ<br>සේවා කාලයෙන් පසු ප්‍රතිලාභ | - | - |

38.2 **සම්බන්ධිත පාර්ශව ගණුදෙණු**

**අධිකාරිය විසින් සම්බන්ධිත පාර්ශවයන් හා සිදුකරන ගණුදෙණු පිළිබද වැදගත් තොරතුරු පහත දක්වා ඇත.**

| සම්බන්ධිත පාර්ශව | වාර්තා කරන කාලය තුළ සිදුකරන ගණුදෙණුවල ස්වභාවය | ගණුදෙණු වටිනාකම | ශේෂය (ගෙවිය යුතු) / ලැබිය යුතු |
|---|---|---|---|
| රජයට අයිති ව්‍යාපාරික ආයතන | ස්ථාවර තැන්පතුවල සහ භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය | 185,000,000.00 | |
| | ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් ආපසු ගැනීම් ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO) | - 44,761,873.00 | 229,761,873 |
| | | - | - |
| | ආපසු මිලදී ගතහැකි ආයෝජන (REPO) ආපසු ගැනීම් | | |
| | | - | - |
| අනිකුත් රජය හා සම්බන්ධිත ආයතන | කොටස්වල ආයෝජනය | - | - |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } අයිඩබ්ලිව්ආර්සී/එන්ජීජේ//01/21

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 මැයි 31 දින

සභාපති,

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් : ලේකම් - කර්මාන්ත අමාත්‍යාංශය

ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව  இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.  No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34  +94 11 2 88 72 23  ag@auditorgeneral.gov.lk  www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. අයිඩබ්ලිව්ආර්සී/එන්ජීජේ/01/21 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 මැයි 31 දින

සභාපති,

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය.

**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

**1.2** තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපිය යුතු රු.104,374,754 ක කෙරීගෙන යන වැඩවල වැඩිවීම සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.202,027,608 ක් වූ වත්කම්වල ඵලදායි ජීව කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 යේ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති දේපල පිරියත හා උපකරණවල ධාරණ අගයෙන් හානිකරණය සඳහා ප්‍රතිපාදන ලෙස රු.3,907,223 ක් අඩුකර තිබුණි.

(ඈ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ කඩ කාමර කුලියට දීමෙන් ලැබිය යුතු කුලී රු.13,394,230 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබු අතර වැඩිපුර ලැබු රු.646,396 ක මුදල ජංගම බැරකම් යටතේ දක්වා නොතිබුණි.

(ඉ) අධිකාරිය විසින් රාජ්‍ය බැංකුවක තැන්පත් කර තිබු රු.371,842,648 ක් වූ ප්‍රදර්ශනාත්මක මැණික් ගල් 03 ක් 2020 වර්ෂය තුල රු.765,316,000 කට ප්‍රත්‍යාගණනය කර තිබු අතර එම ප්‍රත්‍යාගණන වටිනාකම පොත්වල ගැලපීම් නොකර ගිණුම්වල සටහනක් ලෙස පමණක් දක්වා තිබුණි.

(ඊ) අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව වත්කම්වලට අදාල හානිකරණ අලාභ හඳුනාගැනීමේදී එම වත්කම් සමාලෝචනය කර ඊට අදාලව වෙන් කල යුතු හානිකරණ අලාභ වටිනාකම වාර්ෂිකව ඇස්තමේන්තු කල යුතු වුවත් එසේ සිදු නොකර අනෙකුත් වත්කම්, ලැබිය යුතු දෑ හා තැන්පතු සහ අත්තිකාරම් සඳහා පිළිවෙලින් රු.200,000, රු.1,407,972 හා රු.1,433,947 ක් ලෙස වූ එකම වටිනාකමෙන් 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා හානිකරණ අලාභ ලෙස ගිණුම්වලට ගැළපීම් කර තිබුණි.

(උ) වෙළඳ ප්‍රදර්ශනයක් සඳහා ආරක්ෂිත ඇප තැන්පතුවක් ලෙස අධිකාරිය ගෙවා තිබු රු.478,440 ක මුදලක් 2019 වර්ෂයේ අධිකාරිය වෙත නැවත ලැබී තිබුණද මෙම වටිනාකම ලැබිය යුතු ඇප තැන්පතු ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2

(ඔ) අධිකාරියට විරුද්ධව සේවකයෙකු ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරූ නඩුවකදී 2017 වර්ෂයේ ලබාදුන් තීන්දුව ප්‍රකාරව රු.500,000 ක මුදලක් ගෙවීමට නියම කර තිබූ අතර එම මුදල 2018 වර්ෂයේ ගෙවා තිබුණි. එය පෙර කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනා නොගෙන සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු අත්තිකාරම් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට නඩු 06 ක් වෙනුවෙන් ගෙවිය යුතු යැයි අපේක්ෂිත වන්දි මුදල් වටිනාකම රු.6,733,600 ක් අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් දක්වා නොතිබුණි.

(ඒ) 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නීති අංශය විසින් නඩු 05 ක් සඳහා ගෙවිය යුතු යැයි අපේක්ෂිත වන්දි මුදල් ලෙස දක්වා තිබූ රු.2,800,000 ක වටිනාකම නැවත සමාලෝචනය කිරීමකින් තොරව 2020 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේද ගිණුම්වල ගෙවිය යුතු වියදම් ලෙස දක්වා තිබුණි.

(ඔ) වටිනාකම රු.773,280 ක් වූ අසම්භාව්‍ය බැරකමක් ලැබිය යුතු ඇප තැන්පතු ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඕ) ජාතික මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ සනාථ කිරීම් වලට අනුව අධිකාරියෙන් එම ආයතනයට ලැබිය යුතු ශේෂය රු.3,577,395 ක් බව දක්වා තිබූ අතර අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු වටිනාකම් තුල එම ශේෂය ඇතුලත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිඳු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

3

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත්, නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේනම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය

4

ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

5

**2.** වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | **නිරීක්ෂණ** |
| --- | --- |
| (අ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත | |

6

(i) 15(1) වගන්තිය

ශ්‍රී ලංකාව තුල මැණික් කර්මාන්තය කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව වගකිව යුතු එකම බලධාරියා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වන නිසා මැණික් කර්මාන්ත විෂයට අදාළ ප්‍රධාන නියාමන අධිකාරිය තුන්වන පාර්ශවය සමඟ සෘජුවම මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල නියැලීම පනතේ 15(i) වගන්තියට පටහැනි බවට නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණත් සමාලෝචිත වර්ෂය තුල එවැනි මැණික් ගැරීම් ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර තිබුණි.

(ii) 15(2) වගන්තිය

මැණික් පරීක්ෂා කිරීම හා සහතික නිකුත් කිරීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික රසායනාගාර ලියාපදිංචි කිරීමට හා නියාමනය කිරීමට ක්‍රමවේද සකස් කර නොතිබුණි.

(iii)17(1) වගන්තිය

කිසියම් තැනැත්තකු විසින් කිසිම ස්ථානයක ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යාම අධිකාරිය වෙත ඒ කර්මාන්තය කරගෙන යන ස්ථානය ලියාපදිංචි කර ඇත්නම් මිස නොකල යුතු වුවද අධිකාරිය විසින් මේ සම්බන්ධයෙන් නිසි නියාමනයක් සිදුකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 486

චෙක්පත් අගරු වූ විටකදී ඒ සඳහා වන වටිනාකම හැකි ඉක්මනින් මුදලින් අයකරවා ගත යුතු වුවත් වර්ෂ 09 ක් ඉක්මවූ අගරු වූ රු.178,840 ක චෙක්පත් 02 ක් සහ 2020 වර්ෂයේදී අගරු වූ රු.92,139 ක චෙක්පතක් සඳහා මුදල් අයකරගෙන නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 756

සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් 2022 පෙබරවාරි 22 දින වන විටත් සිදුකර නොතිබුණි.

7

| | | |
|---|---|---|
| (ඇ) | 1971 අංක 38 දරණ මුදල් පනතේ 11 වන වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන රු.1,198,624,994 ක් සහ රු.880,819,333 පිළිවෙලින් භාණ්ඩාගාර බිල්පත් වල සහ ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණි. |
| (ඈ) | 2012 ජනවාරි 05 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2012 | ඉදි කිරීම් වැඩ කොන්ත්‍රාත් පමණක් සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන/සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වෙත පැවරිය හැකි නමුත්, මැණික් ව්‍යාපෘති සිදු කිරීමට එම සමිති වෙත බලය පවරා නොතිබුණි. නමුත්, අධිකාරිය විසින් මැණික් ව්‍යාපෘති 4 ක කටයුතු සිදුකිරීමට සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන සමඟ ගිවිසුම්වලට එළඹ එම කටයුතු සිදුකිරීමට බලය පවරා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

**අධිකාරිය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීම**

(i) පෞද්ගලික සමාගමක් මගින් අධිකාරිය පවත්වා ගෙන ගිය ගොඩනැගිල්ල ආසන්නයේ සිදුකල ඉදිකිරීම් කටයුතු නිසා අධිකාරියේ ගොඩනැගිල්ලට හානි සිදුවී ඇති වූ අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ මත සමාලෝචිත වර්ෂයේ එම ස්ථානයෙන් ඉවත් වී තිබුණි. මෙහිදී ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව 2021 සැප්තැම්බර් 03 දින සිට කෙටි කාලයක් සඳහා පෞද්ගලික ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි.

(ii) පසුව ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කර මිල ගණන් කැඳවා තිබූ අතර දැනට ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ල සඳහා හා වෙනත් ගොඩනැගිල්ලක් සඳහා පිළිවෙලින් රු.4,500,000 ක් රු.3,000,000 ක් වශයෙන් මිල ගණන් ලැබී තිබුණු අතර වැඩිමිල ඉදිරිපත් කල අධිකාරිය දැනට ස්ථාපිත ගොඩනැගිල්ල තෝරා ගෙන ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව කුලියට ගත් කාලයද ආවරණය වන පරිදි 2021 අගෝස්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි 2023 අගෝස්තු 31 දින දක්වා කාලපරිච්ඡේදයට බදු ගිවිසුමකට එළඹ තිබුණි. අඩුම ලංසුව ඉදිරිපත්

කල ආයතනය තෝරා නොගැනිම නිසා අධිකාරියට කුලියට ගත් වර්ෂ 2 සඳහා රු.36,000,000 ක් වැඩියෙන් ගෙවිය යුතුව පැවතුණි.

(iii) මෙම ගොඩනැගිල්ලේ දුරකථන හා අභ්‍යන්තර දුරකථන සබඳතා, ජාලගත රැහැන් ඇදීම (Networking) බුමුතුරුණු ඇතිරීම, ව්‍යුහාත්මක වෙන් කිරීම (Partition) සඳහා 2022 අප්‍රේල් 25 විගණිත දින වන විට රු.14,967,592 ක් වැය කර තිබුණි.

(iv) අධිකාරිය නව ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කිරීම සඳහා 2022 අප්‍රේල් 22 විගණිත දින වන විට රු.53,244,339 ක මුදලක් අධිකාරියට දැරීමට සිදුවූ අතර අධිකාරිය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලට හානි සිදුවන පරිදි ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද පුද්ගලික සමාගමෙන් එම මුදල් අයකර ගෙන නොතිබුණි.

**03. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) අධිකාරිය සතු මැණික් ගැරීමේ ව්‍යාපෘති පිළිබඳව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) වටවල මවුන්ජින් මැණික් ගැරීමේ ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු අනුමැතිය ලබා නොගැනීම, ඉඩම් වෙන්දේසියෙන් සියයට 40 ක් ලබා ගැනීමේ පදනම මත මහවැලි අධිකාරිය මෙම ව්‍යාපෘතිය සඳහා එකඟතාවය ලබාදී තිබුණද වෙන්දේසි කිරීමකින් තොරව සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයක් සමඟ අධිකාරිය මැණික් ගැරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘතිය ක්‍රමවත් ලෙස ආරම්භ නොකිරීම හේතුවෙන් රාජ්‍ය ආයතන කිහිපයක් ලාභ කොටස් ඉල්ලීම, වෙන්දේසි කිරීමට කටයුතු නොකිරීම නිසා අධිකාරියට එකවර ලබාගත හැකි විශාල ආදායමක් අහිමි වීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. එමෙන්ම, පාරිසරික හානි ඇති නොවන පරිදි කොන්දේසි ගණනාවකට යටත්ව කැණීම් කිරීමට මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාදී තිබුණු අතර ඔයෙහි වැලි කොට්ට යොදා එක් පැත්තකින් ජලය ගලා යාමට සලස්වා තිබීම, ඔයෙහි පතුල හාරා ඉල්ලම් පස් ගොඩ ගනිමින් පැවතිම ඉවුරු තුල විශාල පස් ගොඩවල් ගොඩ ගසා තිබීම හා මැණික් සේදීම් යන්ත්‍රය ඔය ආසන්නයේ ම සවි කර තිබීම භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ii) කළු ගඟ හැරනියාවක මැණික් ගැරීමේ ව්‍යාපෘතිය සඳහා රු.125,000,000 ක වටිනාකමකට ව්‍යවසායකයෙකු සහ සමෘද්ධි සමිති 02 ක් තෝරාගෙන තිබූ අතර මෙම ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම සඳහා පත්කල කමිටුව සති 02 කට වරක් ව්‍යාපෘති භූමියට පැමිණ පරීක්ෂා කර පිරික්සුම් ලේඛනයක් සම්පූර්ණ කර සහභාගී වූ

නිලධාරීන් අත්සන් කිරීමෙන් පසුව එය අධිකාරියට භාරදිය යුතු වුවත් එසේ භාරදී නොතිබූ අතර ව්‍යාපෘතිය නිසි පරිදි අධීක්ෂණය වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iii) නිධානය මැණික් ගැරීමේ ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සහ කිරිඇල්ල හා අයගම ප්‍රාදේශීය ලේකම් වෙතින් අනුමැතිය ඉල්ලා තිබුණද අනුමැතියන් ලැබී නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යවසාය පාර්ශවයක් සම්බන්ධ කර ගැනීමට මිල ගණන් කැඳවා නොතිබීම නිසා ලබාගත යුතුව පැවති ඉහල ලංසු මුදලක් අහිමි වී තිබුණි. මෙම මැණික් ඉල්ලම් ගොඩගැනීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන 07 ක් සමඟ ගිවිසුම් ගතව තිබූ අතර මැණික් විකිණීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 60 ක් එම සමිති වෙත ලබාදීමට එකඟ වී මෙම සමිතිවල මූල්‍ය හැකියාව සොයා බැලීමකින් තොරව ව්‍යාපෘතියේ කටයුතු සඳහා සම්බන්ධ කරගෙන තිබුණි.

(iv) කළු ගඟ හැරනියාවක හා නිධානය මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල පිළිවෙලින් ලබා ගත් ඉල්ලම් ගෝනි 1289 ක් හා 1975 ක් ගැරීමෙන් තොරව ව්‍යාපෘති භූමියේ රඳවාගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ චීනයේ පැවති ජාත්‍යන්තර එක්ස්පෝ ප්‍රදර්ශනයේ වෙළඳ කුටි සකස් කර ගැනීම සඳහා රු.7,234,920 ක මුදලක් හා ප්‍රදර්ශනකරුවන් තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීම සඳහා රු.41,553 ක මුදලක් දරා තිබුණු අතර මෙම ප්‍රදර්ශනය නියෝජනය කිරීමට ශ්‍රී ලංකාවට නොහැකිවීම හේතුවෙන් දරන ලද සම්පූර්ණ වියදම වූ රු.7,276,473 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඇ) මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවා ආයතනය රු.මිලියන 300.65 ක් වියදම් කර සිදුකරනු ලබන මැණික් නිධි ගවේෂණ ව්‍යාපෘති යටතේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඹුක්කන් ඔය ආශ්‍රිතව අධික මැණික් ලැබෙන ප්‍රදේශ හඳුනාගෙන ඒවා සිතියම් ගත කර අධිකාරිය දැනුවත් කිරීමටද පියවර ගෙන තිබුණි. මෙකී වාර්තා සිතියම් පරිශීලනය කිරීමක් නොකර කුඹුක්කන් ඔය ජලාශයට යටවන භූමියේ මැණික් ඇත්දැයි පරික්ෂා කිරීමට පරීක්ෂණ පතල් කැණීම් ක්‍රියාවලියක් සිදුකිරීම සඳහා රු.5,754,000 ක ඇස්තමේන්තුවක් සකස් කර සමාගමක් වෙත පවරා සමාලෝචිත වර්ෂයේ රු.750,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි.

(ඈ) මොණරාගල බඩල්කුඹුර ගැඩවිල මැණික් ගැරීමේ ව්‍යාපෘතිය පර්චස් 13.5 වූ ඔයක කොටසක මැණික් ගැරීම සඳහා රු.මිලියන 05 ක වටිනාකමකට ව්‍යවසායකයෙකු සහ තවත් සමෘද්ධි සමිති 02 ක් තෝරාගෙන තිබුණි. ව්‍යවසායක පාර්ශවය විසින් ඉන් පර්චස් 9.5 ක් වූ ඉඩම් ප්‍රදේශයක කැණීම් කර ඉතිරි පර්චස් 04 ක ප්‍රමාණයේ කැණීම් කිරීමට නැවත අවසර

10

ඉල්ලා තිබුණි. නිතිපති දෙපාර්තමේන්තුව විසින් මැණික් ව්‍යාපෘති සිදු කිරීමට පනතේ ප්‍රතිපාදන සපයා නොමැති බව දැනුම් දීම මත අදාල ගිවිසුම් කාලය දීර්ඝ නොකර සමෘද්ධි සමිති 02 ක් නැවත සම්බන්ධ කර ගෙන එම ස්ථානයේ දෙවන අධියර යටතේ කැණීම් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත නව ගිවිසුමක් අධිකාරිය විසින් ඇති කරගෙන තිබුණි.

(ඉ) මැණික් වෙන්දේසි කිරීම මගින් ලැබුණු ආදායමෙන් රු.1,793,300 ක මුදලක් සමෘද්ධි ප්‍රජාමුල සංවිධාන 02 ක ඉල්ලීම මත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි නොවූ ව්‍යාජ සමිතියක් වෙත ගෙවා තිබූ අතර තවත් රු.12,507,556 ක් මුදලක් සමෘද්ධි සමිතිවල නමට චෙක්පත් යැවීම වෙනුවට සමෘද්ධි සමතිවල නිලධාරීන් 04 දෙනෙකුගේ පෞද්ගලික බද්ධ ගිණුම් 02 ක් වෙත ප්‍රේෂණය කිරීමට අධිකාරිය පියවර ගෙන තිබුණි.

(ඊ) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් ස්වර්ණාභරණ කර්මාන්තකරුවන්ගෙන් රු.5000 ක වාර්ෂික ලියාපදිංචි ගාස්තුවක් අයකර 2008 වර්ෂයේ ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල පිහිටුවා තිබූ අතර කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් අරමුදල භාවිත කිරීමට නිශ්චිත සැලැස්මක් හෝ ක්‍රමවේදයක් නොවූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.82,536,818 ක අරමුදල් ශේෂය නිශ්කාර්යව තබා තිබුණි.

(උ) යාන්ත්‍රික පතල් කැණීම සඳහා බලපත්‍ර ලබාදී තිබූ ලිපිගොනු අංක CB 2600 A දරන බලපත්‍රලාභියාගෙන් 2020 මාර්තු 02 දිනැති අංක 2165/2 දරන ගාස්තු අයකරන ගැසට් නිවේදනය ප්‍රකාරව විවිධ කාර්යයන් සඳහා රු.1,635,000 ක සේවා ගාස්තුවක් අයකල යුතු වුවත් රු.48,000 ක සේවා ගාස්තුවක් පමණක් අයකර තිබුණි.

(ඌ) මැණික් හා ස්වර්ණාභරණ වෙළඳපල, සංචාරක කර්මාන්තයේ කේන්ද්‍රස්ථානය සහ ව්‍යාපාරික ප්‍රජාවගේ ඉල්ලීම මත 2016 වර්ෂයේ මැණික් ගල් පරීක්ෂා කිරීමට සහ රන් ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා ගාල්ල ප්‍රදේශයේ මැණික් රසායනාගාරයක් පිහිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුල එම රසායනාගාරය දින 24 ක් පමණක් විවෘතව තිබූ අතර එම කාලය තුල රු.175,600 ආදායමක් පමණක් ලබා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ මාස 04 ක කාලයක් තුල සේවා කටයුතු සඳහා රත්න විද්‍යාඥයන් අනුයුක්ත නොකිරීම නිසා එම කාලය තුල කිසිදු සේවාවන් සපයා නොතිබුණි.

(එ) මැණික් බලපත්‍ර නිකුත් කිරීමේදී භාරනු ලබන මැණික් පතල් නැවත පුරවා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.4500, රු.9000 සහ යාන්ත්‍රික පතල් සඳහා වර්ග අඩි 3000-4000 ක් දක්වා ප්‍රමාණයක් සඳහා රු.600,000 සිට රු.5,000,000 ත් ලෙස විශේෂ ආරක්ෂණ ඇපයක් පතල්කරුවන්ගෙන් අයකර තිබුණි. එම පතල් නැවත ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසුව එම ඇප තැන්පතු නැවත ඔවුන් වෙත ලබාදීම සිදුකරන අතර මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය වීමක් සිදුවී තිබේද යන්න පිළිබඳව නිසි නියාමනයක් සිදුවී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල රු.8,980,350 ක මුදලක් පතල් කැණීම්කරුවන් විසින්

නැවත ලබා ගැනීමකින් තොරව අධිකාරියේ තබා තිබූ අතර භූමි ප්‍රතිසංස්කරණය සඳහා අධිකාරියරු.3,099,934 ක මුදලක් පමණක් දරා තිබුණි.

(ඒ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටා තිබූ ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානය සඳහා පෞද්ගලික සමාගමක් සමඟ ඇති කර ගෙන තිබූ බදු කුලී ගිවිසුම 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කර තිබූ අතර ආරක්ෂිත ඇප තැන්පතු රු.13,394,230 ක් 2022 අප්‍රේල් 30 විගණිත දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඔ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත 1993 වර්ෂයේ අනුමත කර ගැනීමෙන් පසුව එය කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේද පියවර ගෙන නොතිබුණි.

(ඕ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 14 (ග) වගන්තිය ප්‍රකාරව මැණික් කර්මාන්තයේ හා ස්වර්ණාභරණ කර්මාන්තයේ වැඩ කරන තැනැත්තන්ගේ ජීවිත හා ශරීරාංග අනතුරුවලින් ආරක්ෂා කිරීම සඳහා ගතයුතු ආරක්ෂක පියවර විධිමත් කිරීම හා පාලනය කිරීමේ අරමුණින් මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කිරීමේදී රු.500 බැගින් අයකර මැණික් ගැරීමේ සුභසාධක අරමුදලට බැර කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට මෙම අරමුදලේ ශේෂය රු.34,154,875 ක් වූ අතර මෙම අරමුදල මගින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

12